## 2018/11/13 දින පැවති මහාසභා රැස්වීම් වාර්තාව

2018/11/13 දින පෙ.ව. 9.00 ට නාගොඩ ප්‍රදේශීය සභා රැස්වීම් ශාලාවේදී රැස්වීම පවත්වන ලදී.

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | ගරු සභාපති |
| 2. එම්.කේ. ගාමිණී සුසන්ත මහතා | ගරු උප සභාපති |
| 3. ඒ.එච්.වී. අජිත් කුමාර මහතා | ගරු මන්ත්‍රී |
| 4. ඩබ්. ජී. නිශාන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 5. සී.වී. සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 6. බන්දුල සමනන්ත හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |
| 7. එච්.ජී. තරංග සුදර්ශන මහතා | ගරු මන්ත්‍රී |
| 8. කුමාරගේ වසන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 9. එච්.කේ.ලක්රුවන් සම්පත් මහතා | ගරු මන්ත්‍රී |
| 10. එන්.ජී. ගයාන් මධුසංඛ මහතා | ගරු මන්ත්‍රී |
| 11. ධර්මසිරි ගනේවත්ත මහතා | ගරු මන්ත්‍රී |
| 12. පියල් හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |
| 13. සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය | ගරු මන්ත්‍රිනී |
| 14. එඩේරආරච්චි චෙරංග ලක්මාල් මහතා | ගරු මන්ත්‍රී |
| 15. නාපෙ විතානගේ සමන් මහතා | ගරු මන්ත්‍රී |
| 16. සී. වනිගරත්න මහතා | ගරු මන්ත්‍රී |
| 17. විලේගේ අමර ධනංජය මහතා | ගරු මන්ත්‍රී |
| 18. ප්‍රියන්තා ගුණසේකර මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 19. එම්.එම්.දිසානායක මහතා | ගරු මන්ත්‍රී |
| 20. එන්.ඩබ්. පතිනායක මහතා | ගරු මන්ත්‍රී |
| 21. විජිත් වීරගුණරත්න සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 22. කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 23. කේ.ඒ.සී. දිල්රුක්ෂි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 24. එච්.එච්. ගයන්ති කුමාරි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 25. ඩබ්. කේ. නෙලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 26. වී.ජී.අරුණ ශාන්ති මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 27. පී.ජී. රංජිත් ජයවීර මහතා | ගරු මන්ත්‍රී |

**01. ආගම සිහි කිරීම**

2018.11.13 දින මහා සභාව ආරම්භ කිරීමට පළමුව පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහි කරීමෙන් අනතුරුව මිය ගිය ඥාතීන් රණවිරුවන් සිහිපත් කර විනාඩි 01 ක නිශ්ශබ්දතාවයක් පළ කළේය.

**02. මූලාසනයේ පිළිගැනීමේ කතාව**

සුභ උදෑසනක් වේවා සියලුම දෙනාට. උප සභාපතිතුමා ඇතුළු පැමිණ සිටින සියලුම මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලා ඉතා ගෞරවයෙන් පිළිගනිමින් 2018 නොවැම්බර් මාසයට අදාල සැසි වාරය ආරම්භ කිරීමට බලාපොරොත්තු වෙනවා.

**03. පසුගිය වාර්තාවේ යෝජනා සඳහා ඉදිරිපත් කර ඇති සංශෝධන ඉදිරිපත් කිරීම**

නැත.

04. **2018.10.09 දින පැවති මහ සභා වාර්තාවේ නිවැරදි කිරීම් ඇත්නම් ඒවා නිවැරදි කර වාර්තාව ස්ථිර කිරීම.**

**ඒ අනුව සභා වාර්තාව සභාව පිළිගතයුතු සත්‍ය වාර්තාවක් ලෙස ගරු උපසභාපති ගාමිණී සුසන්ත මහතා විසින් යෝජනා කළ අතර ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

**05. විශේෂ නිවේදන**

01 පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන දෙපාර්තමේන්තුව, ගාල්ල විසින් යොමු කරන ලද පළාත් පාලන ආයතන සතු අරමුදල් යොදාගෙන සිදුකරනු ලබන සංවර්ධන කටයුතු - 2018 සම්බන්ධ 2018.10.16 දිනැති ලිපිය සභාගත කරන ලදී.

02. . පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන දෙපාර්තමේන්තුව, ගාල්ල විසින් යොමු කරන ලද සභා බල ප්‍රදේශයන්හි පැවැත්වෙන ආගමික උත්සව පිළිබඳ තොරතුරු රැස්කිරීම සම්බන්ධ 2018.11.07 දිනැති ලිපිය සභාගත කරන ලදී.

**06. සන්දේශ පෙත්සම් පැමිණිලි ඉදිරිපත් කිරීම**

01. ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය, නාගොඩ විසින් යොමු කරන ලද අනවසර ගොඩ කිරීමක් සම්බන්ධ 2018.10.15 දිනැති ලිපිය සභාගත කරන ලදී.

02. 214 ඒ මලාමුර ග්‍රාම නිලධාරී වසමේ ජනතාව විසින් ප්‍රාදේශීය ලේකම් වෙත යොමු කරන ලද කටු පොල් ව්‍යාප්ත වීම සම්බන්ධ ලිපියෙහි ඡායා පිටපත සභාගත කරන ලදී.

03. ශ්‍රියානි ඩබ්.රාජපක්ෂ, විදුමුතු පෙරපාසල, උක්ඕවිට විසින් නාගොඩ ප්‍රාදේශීය සභාවේ උඩුගම බහු කාර්යය ගොඩනැගිල්ල සහන මිලට ලබා දෙන ලෙස ඉල්ලා යොමු කරන ලද 2018.11.10 දිනැති ලිපිය සභාගත කරන ලදී.

04 විදුහල්පති ගා/උඩුගම ප්‍රාථමික විද්‍යාලය විසින් නාගොඩ ප්‍රාදේශීය සභාවේ ශාලාව 2018.11.27 දිනට ලබා ගැනීම සඳහා යොමු කරන ලද 2018.11.08 දිනැති ලිපිය සභාගත කරන ලදී.

**07.** **යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**

**නැත.**

**08.** **යථා පරිදි කල් දී ඇති යෝජනා**

**8.1 ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා ඉදිරිපත් කරන පරිපාලන යෝජනා**

01.පෙර පාසල් හා පුස්තකාල සඳහා අවශ්‍ය ලිපි ලේඛන ලබා දීමට අනුමැතිය ලබාදෙන ලෙස ඉල්ලීම.
**සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කරන ලදී.**

02.ප්‍රාදේශීය සභාවේ කටයුතු සඳහා භාවිතයට ගනු ලබන ප්‍රා.ස.වාර්තා,මුද්‍රිත ලේඛන,පෝර්ම 441/3,තුන්වන කරණ,කොළඹ පාර,මීගමුව,ලිපිනයේ පිහිටි එස්.බී. ප්‍රින්ටර්ස් ප්‍රයිවට් ලිමිටඩ් වෙතින් මිලදී ගැනීමට අනුමැතිය ලබාදෙන ලෙස ඉල්ලීම.
**සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කරන ලදී.**

03.2019 වර්ෂය සඳහා ඇමතුම් දිනපොත් හා දින දර්ශන රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවෙන් මිලදී ගැනීමට අනුමැතිය ලබාදෙන ලෙස ඉල්ලීම.
**සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කරන ලදී.**

04.PF7360 දරණ කැබ් රථයේ එයාර් බෑග් පද්ධතිය අලුත්වැඩියා කිරීම සඳහා අනුමැතිය ලබාදෙන ලෙස ඉල්ලීම.

**ඉහත සඳහන් යෝජනාව ක්‍රියාත්මක කිරීම සුදුසු බව ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා විසින් යෝජනා කල අතර ගරු මන්ත්‍රී වී. වී. සහබන්දු මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය**

05. PF7360 දරණ කැබ් රථය සේවා කිරීම සඳහා අනුමැතිය ලබාදෙන ලෙස ඉල්ලීම.
**ඉහත සඳහන් යෝජනාව ක්‍රියාත්මක කිරීම සුදුසු බව ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා විසින් යෝජනා කල අතර ගරු මන්ත්‍රී වී. වී. සහබන්දු මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය**

06. PF7360 දරණ කැබ් රථයේ රක්ෂණ සහතිකය සහ ආදායම් බලපත්‍රය අලුත් කිරීම සඳහා අනුමැතිය ලබාදෙන ලෙස ඉල්ලීම.

07.252-6478 දරණ කැබ් රථයේ දූම් වාර්තාව සහ ආදායම් බලපත්‍රය ලබා ගැනීම සඳහා අනුමැතිය ලබාදෙන ලෙස ඉල්ලීම.

**වාහන සම්බන්ධව නියමිත කාලය තුල රක්ෂණ සහතික ලබා ගැනීම සහ ආදායම් බලපත්‍ර ලබාගැනීම සිදු කල යුතු බැවින් ඒ සඳහා සභාවට ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවන බවත් වියදම් දැරීමෙන් පසු සභාවට ඉදිරිපත් කිරීම සුදුසු බවත්, ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල මහතා යෝජනා කල අතර ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කරන ලදී.**

08.1988 ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති 203 වගන්තිය ප්‍රකාරව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයක් පත්කිරීම.

**සමීක්ෂණ මණ්ඩලය සඳහා ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා සුදුසු බව ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා යෝජනා කල අතර ගරු මන්ත්‍රිනී අරුණ ශාන්ති මහත්මිය විසින් ස්ථිර කරන ලදී**

**සමීක්ෂණ මණ්ඩලය සඳහා ගරු මන්ත්‍රිනී සුභාෂි මෙනවිය  සුදුසු බව ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා යෝජනා කල අතර ගරු උප සභාපතිතුමා විසින් ස්ථිර කරන ලදී**

**සමීක්ෂණ මණ්ඩලය සඳහා ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා සුදුසු බව ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා යෝජනා කල අතර ගරු මන්ත්‍රි තරංග සුදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදී**

09.2018 වර්ෂයේ ඉදිරි මාස සඳහා තැපැල් ගාස්තු සඳහා මුදල් වෙන් කර දෙන ලෙස ඉල්ලීම.

**ඉදිරි මාසය වෙනුවෙන් රු. 5000.00 ක් වෙන් කිරීමට ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා විසින් ස්ථිර කරන ලදී.**

10.B.D.රුවිනි චතුරිකා නිවසේ අලුත්වැඩියාව සඳහා දසමස් වැටුප් අත්තිකාරම් ලබාදෙන ලෙස ඉල්ලීම

**සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

11.විගණකාධිපති දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු හිග විගණන ගාස්තු සම්බන්ද යෝජනාව.

**මෙම මුදල වාරිකව ගෙවීමට ගරු සභාපතිතුමා විසින් යෝජනා කල අතර එය ඒකමතිකව සභා සම්මත විය.**

12.2019 වර්ෂය සඳහා සැපයුම් කරුවන් ලියාපදිංචි කිරීම සඳහා අවසර ඉල්ලීම.

13.2019 වර්ෂය සඳහා සැපයුම් කරුවන් ලියාපදිංචි කිරීමට අදාල දැන්වීම් පුවත්පතේ පළ කිරීම සඳහා ඉල්ලීම.

**සැපයුම් කරුවන් ලියාපදිංචි කිරීමේ දැන්වීම ගරු සභාපතිතුමා විසින් කියවනු ලදුව එය පුවත්පතේ පළ කිරීමට ඒකමතිකව කැමැත්ත පළ කරන ලදී.**

14."කුමුදු විලට සඳරැස් කලා මංගල්‍යය - 2018'' සඳහා මූල්‍යමය අනුග්‍රහයක් දැක්වීම සඳහා අනුමැතිය ඉල්ලීම.

**දරුවන් වෙනුවෙන් මෙම ගෙවීම සිදු කිරීම සඳහා ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අනුමැතිය සඳහා යැවීමට තීරණය විය.**

15. නාගොඩ ප්‍රාදේශීය සභාවේ ඉදිරි ගෙවීම් වාර්තාව ඉදිරිපත් කිරීම.

## <u>2018.11.13 දින පවත්වනු ලබන මහසභා රැස්වීම සඳහා ඉදිරිපත් කළ යුතු ඉදිරි ගෙවීම් වාර්තාව.</u>

<u>ආවරණ අනුමැතිය යටතේ කල ගෙවීම්</u>

01. කෙත්සිරි කමියුනිකේෂන් ඇන්ඩ් ප්‍රින්ටර්ස්,

2018 නොවැම්බර් මස පැවැත්වීමට නියමිත සාහිත්‍ය නිර්මාණ තරඟාවලියේ චිත්‍ර තරඟ පැවැත්වීමට අවශ්‍ය චිත්‍ර කොල ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම - රු. 2700.00

02. පෝස්ට් මාස්ටර් ජනරාල් ගි.අ. 013100199027346 ට බැර

තැපැල් ගාස්තු ගෙවීම - 2018.10.23 - රු. 5000.00
තැපැල් ගාස්තු ගෙවීම - 2018.10.18 - රු. 5000.00

03. ලේකම්, නාගොඩ ප්‍රාදේශීය සභාව

ඇප්තොප්වත්ත ඉඩමේ පොල් කැඩීම වෙනුවෙන් පොල් ගසකට රු. 100.00 බැගින් පොල් ගස් 70 ක් සඳහා මුදල් ගෙවීම - රු. 7000.00

**<u>ඉදිරි ගෙවීම් (පොදු අරමුදල්)</u>**

**<u>01. 2018 සැප්තැම්බර් මස විදුලි බිල්පත්</u>**

| | | | |
|---|---|---|---|
| I. | 2813189405 | - තල්ගස්වල පෙර පාසල | - රු. 276.60 |

**<u>2018 ඔක්තෝම්බර් මස විදුලි බිල්පත්</u>**

| | | | |
|---|---|---|---|
| **II.** | 4501090200 | - මාපලගම වෙළඳ සංකීර්ණ කොරිඩෝව | - රු. 734.10 |
| **III.** | 4593739918 | -මාපලගම උප කාර්යාලය | - රු. 532.80 |
| IV. | 4509082908 | - උක්ඹිවිට පෙර පාසල | - රු. 349.80 |
| V. | 2810125104 | - දීප්ති පෙර පාසල | - රු. 276.60 |
| VI. | 2810236100 | - මාපලගම කරුණාතිලක ක්‍රීඩාංගනය | - රු. 276.60 |
| **VII.** | 4509082800 | - උදාර පෙර පාසල | - රු. 313.20 |
| **VIII.** | 4591713210 | - ප්‍රධාන කාර්යාලය | - රු. 5437.20 |
| **IX.** | 4507357802 | - සමනල පෙර පාසල | - රු. 294.90 |
| **X.** | 8617046104 | - උඩුගම බහු කාර්ය මධ්‍යස්ථානය | - රු. 1319.70 |
| XI. | 2813038709 | - කැකුළු පෙර පාසල | - රු. 240.00 |
| XII. | 8616374000 | - ටොයිලට් කම්ප්ලෙක්ස් | - රු. 240.00 |
| **XIII.** | 8616373802 | - උඩුගම පොළ | - රු. 240.00 |
| XIV. | 2813189405 | - තල්ගස්වල පෙර පාසල | - රු. 276.60 |
| **XV.** | 2809093105 | - කොම්පෝස්ට් ව්‍යාපෘතිය | - රු. 1594.20 |

**XVI.** 4599064300 - ගෝණදෙනිය පෙර පාසල - රු. 258.30

**02. ශ්‍රී ලංකා ටෙලිකොම් පී එල් සී,**

**<u>2018 සැප්තැම්බර් මස දුරකථන බිල්පත්</u>**

091-2296577 - මාපලගම උප කාර්යාලය -රු. 516.38
091- 2296537 - ප්‍රධාන කාර්යාලය -රු. 4781.03
091-2296433 - ප්‍රධාන කාර්යාලය - රු. 8307.05

**<u>2018 ඔක්තෝම්බර් මස දුරකථන බිල්පත්</u>**

091-2296577 - මාපලගම උප කාර්යාලය -රු. 524.76
091- 2296537 - ප්‍රධාන කාර්යාලය -රු. 5695.09
091-2296433 - ප්‍රධාන කාර්යාලය - රු.10502.04

**<u>2018 අගෝස්තු මස දුරකථන බිල්පත්</u>**

091-2231201 - සභාපතිතුමාගේ නිවස - රු. 4184.79

**<u>2018 සැප්තැම්බර් මස දුරකථන බිල්පත්</u>**

091-2231201 - සභාපතිතුමාගේ නිවස - රු. 3067.04

**03. සී/ස ලංකාබෙල් සමාගම**

0915701722 උප සභාපතිතුමාග් නිවස (2018.09.16- 2018.10.15) - රු. 499.05

**04.ශ්‍රී ලංකා මොබිටෙල් පුද්ගලික සමාගම**

පුරනැගුම ව්‍යාපෘතියේ කෙටි පණිවිඩ සේවාව සඳහා බිල්පත (2018.09.25) - රු. 74.84

**05.ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය**

33/53/003/008/11 - උඩුගම උප කාර්යාලය (2018.09.17 – 2018.10.17) -රු. 1850.35

**06.ලේකම්, නාගොඩ ප්‍රාදේශීය සභාව**

I. මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන් විසින් ආහාර පනතේ රාජකාරි සඳහා ආහාර සාම්පල් ලබා ගැනීම සඳහා මුදල් ප්‍රතිපූර්ණය කිරීම

i. එච්. එල්.එන්.පී. කුමාර මයා, ම.සෞ.ප. - රු. 1000.00
ii. එල්.ඒ.ජේ. දිවාකර මයා, ම.සෞ.ප. - රු. 1000.00

II. සභාපතිතුමා,උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රී මණ්ඩලයට 2018 ඔක්තෝම්බර් මස ඉන්ධන දීමනා ලබා දීමේ බිල්පත පියවීම -රු.81000.00

III. PF 7360 දරණ කැබ් රථයේ දුම් වාර්ථාව ලබා ගැනීම සඳහා - රු. 1230.00
PF 7360 දරණ කැබ් රථයේ ආදායම් බලපත්‍රය ලබා ගැනීම සඳහා - රු. 9900.00
252 6478 දරණ කැබ් රථයේ දුම් වාර්ථාව ලබා ගැනීම සඳහා - රු. 1230.00
252 6478 දරණ කැබ් රථයේ ආදායම් බලපත්‍රය ලබා ගැනීම සඳහා - රු. 9900.00

IV. සභාපතිතුමාගේ රාජකාරි කටයුතු සඳහා කැබ් රථය අධිවේගී මාර්ගයේ ධාවනය කිරීම වෙනුවෙන් බිල්පත් මුදල් ප්‍රතිපූර්ණය

2018.10.03 සභා කාර්යලයට අවශ්‍ය උපකරණ ලබා ගැනීම වෙනුවෙන්
කොළඹ යාම සඳහා - රු. 850.00
2018.10.13 පුහුණු වැඩමුළුව සඳහා මාතර යාම වෙනුවෙන් - රු. 200.00
2018.10.19 සභා කාර්යලයට අවශ්‍ය උපකරණ ලබා ගැනීම වෙනුවෙන්
මාතර යාම සඳහා - රු. 400.00
2018.10.26 ඉඩම් අමාත්‍යාංශයට යාම වෙනුවෙන් - රු. 1050.00
2018.10.29 අග්‍රාමාත්‍ය කාර්යාලයට යාම වෙනුවෙන් - රු. 850.00

V. ගරු උප සභාපතිතුමාට නිල දුරකථන පහසුකම් ලබා දීම සඳහා ලංකාබෙල් ආයතනය වෙත ගෙවන ලද මුදල් ප්‍රතිපූර්ණය - රු. 500.00

**07.ගමන් වියදම් ගෙවීම**

**2018 සැප්තැම්බර් මස ගමන් වියදම්**

<u>ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම</u>

| | | |
|---|---|---|
| ආර්.ඒ.ඒ.එල්.රත්නායක මිය | - සංවර්ධන නිලධාරී | - රු. 858.00 |
| එම්. ඒ. ඩී. චන්ද්‍රප්‍රභා මෙය | - කළමනාකරණ සහකාර | - රු. 516.00 |

**2018 ඔක්තෝම්බර් මස ගමන් වියදම්**

<u>ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම</u>

| | | |
|---|---|---|
| එම්.එච්. ෆර්සියා ෆර්වීන් මිය | - ලේකම් | - රු.1065.00 |
| එස්.කේ.මල්ලවආරච්චි මයා | - කළමනාකරණ සහකාර | -රු. 1270.00 |
| එම්.ඒ.වසන්ත මයා | - රියදුරු | - රු.4550.00 |
| බී.ජී. පියතිලක මයා | - රියදුරු | - රු. 700.00 |

<u>පුහුණු වැඩසටහන් සඳහා</u>

| | | |
|---|---|---|
| එම්.එච්. ෆර්සියා ෆර්වීන් මිය | - ලේකම් | - රු.2126.00 |
| ඉරේෂා මදනායක මිය | - සංවර්ධන නිලධාරී | - රු. 1800.00 |
| එච්.එම්.හේවාවිතාන මෙය | - කළමනාකරණ සහකාර | - රු. 2634.00 |
| බී. ඩී. එල්. ඩී. කුමාරි මිය | - පුස්තකාලයාධිපති | - රු. 2628.00 |
| එම්. ඒ. ඩී. චන්ද්‍රප්‍රභා මෙය | - කළමනාකරණ සහකාර | - රු. 878.00 |
| ටී. එස්. මනම්පේරි මෙය | - පුස්තකාලයාධිපති | - රු. 2628.00 |
| කේ. කේ. අවන්ත පද්ම මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 1748.00 |

**2018 නොවැම්බර් මස ගමන් වියදම්**

<u>පුහුණු වැඩසටහන් සඳහා</u>

| | | |
|---|---|---|
| එච්.ඩබ්.එස්. මල්කාන්ති මිය | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 878.00 |
| චතුරානි පතිනායක මිය | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 878.00 |
| වයි. ජී. ගංගා පද්මිණී මෙය | - පුස්තකාල සහායක | - රු. 876.00 |

<u>ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම</u>

| | | |
|---|---|---|
| එස්.කේ.මල්ලවආරච්චි මයා | - කළමනාකරණ සහකාර | -රු. 550.00 |

**08.අතිකාල දීමනා ගෙවීම්**

**2018 අගෝස්තු මස**

ඒ.එච්.ජී. සංජීව මයා (මුර සේවය වෙනුවෙන්)- වැඩ/ක්ෂේත්‍ර කම්කරු - රු. 3960.00

**2018 සැප්තැම්බර් මස**

බී.ජී. පියතිලක මයා - රියදුරු - රු. 2286.18
ඒ.එච්.ජී. සංජීව මයා (මුර සේවය වෙනුවෙන්)- වැඩ/ක්ෂේත්‍ර කම්කරු - රු. 4260.00

**2018 ඔක්තෝම්බර් මස**

බී.ජී. පියතිලක මයා - රියදුරු - රු. 3209.44
එම්.ඒ.වසන්ත මයා -රියදුරු - රු. 7034.00
ඒ.එච්.ජී. සංජීව මයා (මුර සේවය වෙනුවෙන්)- වැඩ/ක්ෂේත්‍ර කම්කරු - රු. 4200.00
ඩී.ටී.ආර්.ඒ. ගුණරත්න මයා - මුරකරු - රු.6198.75

ඩබ්.කේ. සම්පත් සංජීව මයා (මුර සේවය වෙනුවෙන්) - ආදේශක රියදුරු - රු. 4500.00
එන්.එම්.රජිත මයා - ආදේශක මුරකරු - රු. 3000.00

**09.2018 ඔක්තෝම්බර් මස පරිවර්ජිත ගමන් වියදම් ගෙවීම (ක්ෂේත්‍ර නිලධාරින් සඳහා)**

ආර්.ඒ.ඒ.එල්.රත්නායක මිය - සංවර්ධන නිලධාරී - රු. 3000.00
දිලිනි දිසානායක මිය - තාක්ෂණ සේවා නිලධාරී - රු. 4000.00
කුසල් අසංක එදිරිසිංහ මයා - තාක්ෂණ සේවා නිලධාරී - රු. 4000.00
කේ.ජී.ජයනි මිය - සංවර්ධන නිලධාරී -රු. 3000.00
ඩබ්.ජේ.ඒ.ශානක මයා -ආදායම් පරීක්ෂක -රු .3000.00

**10.එච්.ඩබ්.ප්‍රියන්ත අමරනාත් මයා, ම.සෞ.ප**

I. ආහාර පනතේ නඩු සඳහා බද්දේගම මහේස්ත්‍රාත් අධිකරණයට යාම වෙනුවෙන් ගෙවීම (2018/10/26) - රු. 504.00
II. රෝග නිවාරණ පනතේ නඩු සඳහා උඩුගම මහේස්ත්‍රාත් අධිකරණයට යාම වෙනුවෙන් ගෙවීම (2018/10/23) - රු. 492.00

**11. යු. කේ. ජයන්ත මයා, ම.සෞ.ප**

I. ආහාර පනතේ නඩු සඳහා බද්දේගම මහේස්ත්‍රාත් අධිකරණයට යාම වෙනුවෙන් ගෙවීම (2018/10/26) - රු. 500.00

**12. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව,**

නාගොඩ ප්‍රාදේශීය සභාවේ PF 7360 කැබ් රථය රක්ෂණය කිරීමේ ගාස්තු
(2018.12.08- 2019.12.07 දක්වා) - රු. 88980.03

**13.ආර්. ඒ.රංජිත් මානෙල් මයා, හොටෙල් සීගිරි,නාගොඩ**

2018.10.09 දින පැවති මහ සභා රැස්වීම සඳහා සංග්‍රහ කිරීමේ වියදම් (ආහාර සඳහා) - රු.4751.00

**14.සී/ස යක්කලමුල්ල විවිධ සේවා සමූපකාර සමිතිය**
**2018 සැප්තැම්බර් මස ඉන්ධන ලබා ගැනීමේ බිලපත්**

PF 7360 කැබ්රථය ඩීසල් ලීටර් 532 ක් - රු. 64421.00

LL 7103 ටිපර් රථය ඩීසල් ලීටර් 170 ක් - රු. 20660.00
LL 7366 ට්‍රක් බවුසරය ඩීසල් ලීටර් 150 ක් - රු. 18200.00
252-6478 කැබ් රථය ඩීසල් ලීටර් 199 ක් - රු. 24027.00
RD 9457 ට්‍රැක්ටරය ඩීසල් ලීටර් 75 ක් - රු. 9070.00
RA 8570 ට්‍රැක්ටරය ඩීසල් ලීටර් 20 ක් - රු. 2460.00

**15.එච්.එල්.කේ.ශ්‍රීනිත් රුක්ෂාන්, උඩුගම**
උඩුගම මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම
2018 ඔක්තෝම්බර් - රු. 5200.00

**16.බී.ජේ. කරුණාරත්න මයා, රත්නගිරි ස්ටෝර්ස්, මාපලගම**
මාපලගම මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම
2018 ජුනි - රු. 4170.00
2018 ජූලි - රු. 4340.00
2018 අගෝස්තු - රු. 4240.00

**17.එම්. ඒ.සිරිපාල මයා, සේසිරි ස්ටෝර්ස්, මාපලගම**
මාපලගම මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම
2018 ජුනි - රු. 2220.00
2018 ජූලි - රු. 2445.00
2018 අගෝස්තු - රු. 2270.00

**18.දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, කොළඹ**

i. වැටුපෙන් අය කර ගත් මුද්දර බදු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේශනය කිරීම 2018.07.01-2018.09.30 - රු. 4575.00
ii. හිඟ එකතු කල අගය මත බදු මුදල කොටස් වශයෙන් ආදායම් බදු දෙපාර්තමේන්තුවට ප්‍රේශනය කිරීම - රු.12000.00

**19. ලියනගේ ට්‍රේඩ් සෙන්ටර්, ගා/ නාගොඩ**

i. 2018.09.28 දින පැවති ප්‍රාදේශීය සභාවේ මහජන නියෝජිතයින්ගේ විශේෂ කමිටුව සඳහා සංග්‍රහ වියදම් පියවීම - රු. 700.00
ii. 2018 ඔක්තෝම්බර් මස පැවති මහ සභා රැස්වීමට අදාල සංගීහ වියදම් බිල්පත (තේ සඳහා) - රු. 1641.80
iii. සෞඛ්‍ය කම්කරුවන් සඳහා සබන් ලබා ගැනීමේ බිල්පත පියවීම - රු. 3120.00

**20.නීතිඥ හේමන්ත පී. ඩබ් විතාරණ මයා, කොටුව, ගාල්ල**

I. P 15977 දරණ 2018.11.12 දින පැවැති නඩුවෙහි නීතිඥ සටහන් ගැනීමේ ගාස්තු - රු. 3000.00
II. P 14658 දරණ 2018.12.05 දින පැවැත්වීමට නියමිත නඩුවේ නීතිඥ හා සටහන් තැබීමේ ගාස්තු - රු. 5000.00

**21. ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ටාර්, ඇල්පිටිය**

i. 2015 පෙබරවාරි සිට 2016 දෙසැම්බර් දක්ව මුද්දර ගාස්තු උපලේඛන පිළියෙල කිරීම වෙනුවෙන් කාර්ය මණ්ඩල දීමනා ගෙවීම් (ගාස්තු සංශෝධනයට පෙර) - රු. 925.00

ii. 2015 පෙබරවාරි සිට 2016 දෙසැම්බර් දක්ව මුද්දර ගාස්තු උපලේඛන පිළියෙල කිරීම වෙනුවෙන් කාර්ය මණ්ඩල දීමනා ගෙවීම් (ගාස්තු සංශෝධනයට පසු) - රු.4500.00

**22. ආර්. යූ. එස්. ආදිහෙට්ටි මයා, උඩුගම**

ළමා දින උත්සවය සඳහා වේදිකා සැරසීමට කුලී පදනම මත ලබා ගත් තිර රෙදි 02 සඳහා කුලීය ගෙවීම - රු. 500.00

**23.ඒ.කේ.නිලන්ති සජීවනී,ග්‍රාෆ් ටෙල් කමියුනිකේෂන්**

i. සභාපතිතුමා,උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රී මණ්ඩලයට 2018 ඔක්තෝම්බර් මස දුරකථන පෙර ගෙවුම් කාඩ්පත් ලබා දීමේ බිල්පත පියවීම -රු.28500.00

ii. 2018 ඔක්තෝම්බර් මස සභා වාර්තා පිටපත් මුද්‍රණය කිරීම වෙනුවෙන් ගෙවීම - රු. 3600.00

**24. එම්. ඒ. ආරියවංශ මයා, ආරියවංශ මෝටර්ස්, නාගොඩ**

RD 8570 ට්‍රැක්ටරයේ රේඩියේටර් හෝස් එක දැමීම හා ඩීසල් පිල්ටර් ගලවා පිරිසිදු කර නැවත සවි කිරීමේ බිල්පත පියවීම - රු. 1000.00

**25. ආසිරි ටයර් ට්‍රේඩර්ස් ඇන්ඩ් ඔටෝ සර්විසස්, මාපලගම**

RD 8570 ට්‍රැක්ටරය සඳහා රේඩියේටර් හෝස් එක මිළදී ගැනීමේ බිල්පත පියවීම - රු. 690.00

**26. ඔරියන්ට් ඉලෙක්ට්‍රිකල්ස්, කොළඹ 10**

වීථි පහන් අළුත්වැඩියාව සඳහා බන්ඩල් ලයින් ටැප් ලබා ගැනීමේ බිල්පත - රු. 18500.00

**27. ලක්දිව් එන්ටර්ප්‍රයිසස්, කොට්ටව**

වීථි පහන් අළුත්වැඩියාව සඳහා තම්බලර් ස්විච් සහ හෝල්ඩර් ලබා ගැනීමේ බිල්පත - රු. 12732.00

වීථි පහන් අළුත්වැඩියාව සඳහා තම්බලර් ස්විච් සහ වයර් රෝල් ලබා ගැනීමේ බිල්පත - රු. 21568.00

**28. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව,**

දුම්රිය බලපත්‍ර ගාස්තු ගෙවීම

ඩබ්. ජේ. අයේෂ් ශානක මයා - ගාල්ල - බණ්ඩාරවෙල දක්වා - රු. 880.00

**29. හඳුන්නෙත්ති ටයර් ඇන්ඩ් බැටරි සෙන්ටර්, උඩුගම**

බැටරි ලබා ගැනීමේ බිල්පත පියවීම

LL 7650 NT 800 බැටරිය - රු. 30100.00

LL 7366 NT 700 බැටරි 02 - රු. 45300.00

**30. සි/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ විවිධ නීතිගත සංස්ථාව, මාතර**

නාගොඩ ප්‍රාදේශීය සභාවේ සේවය කරන මුරකරුවන් සඳහා ටෝච් ලබා ගැනීමේ බිල්පත - රු.12450.00

31. යුනයිටඩ් මෝටර්ස්, මාතර

PF 7360 දරණ කැබ් රථය සේවා කිරීම හා හෝන් එක, පාකින් බල්බ් එක දැමීමේ බිල්පත- රු. 28333.28

32. ජගත් ඉලේපෙරුමආරච්චි, නාගොඩ
2018/10/25 දින පවත්වන ලද සාහිත්‍ය උළලේ ආරාධනාපත්‍ර මුද්‍රණය - රු. 3225.00
වෙනුවෙන් මුදල් ගෙවීම
2018/10/05 දින පවත්වන ලද ළමා දින උත්සවයේ ආරාධනාපත්‍ර මුද්‍රණය - රු. 5160.00
වෙනුවෙන් මුදල් ගෙවීම

33. ඊ්.ඒ. සමන් කුමාර එදිරිසිංහ, උඩුගම
PF 7360 දරණ කැබ්රථයේ පිටුපස දකුණු පැත්තේ බ්‍රේක් ලයිට්, හෝල්ඩර් 01,
ගලවා සවි කිරීමේ බිල්පත් පියවීම - රු. 6450.00

<u>පොදු අරමුදල් කර්මාන්ත</u>

**34. ඒ. කේ. ජානක ගයාන් සංජීව, ගයාන් එන්ටර්ප්‍රයිසස්, යටලමත්ත**

i. බෝවිටියමුල්ල බීඩී 5 කන්ද මාර්ගය අළුත්වැඩියා කිරීම සඳහා ජේ.සී.බී. යන්ත්‍ර යොදවා ගැනීමේ බිල්පත පියවීම මීටර් පැය 6.8 - රු. 15000.00
**ii.** යටලමත්ත පාසල් කන්ද මාර්ගය අළුත්වැඩියා කිරීම සඳහා ජේ.සී.බී. යන්ත්‍ර යොදවා ගැනීමේ බිල්පත පියවීම මීටර් පැය 8 - රු. 20000.00

**35. ටී.ජී. සුමනසිරි මයා, ටී.ජී. හාඩ්වෙයාර්, නාගොඩ**
සංවර්ධන ගම්මානයට ප්‍රවේශ වන ස්ථානයට කොන්ක්‍රීට් දමා අළුත්වැඩියා කිරීමේ බිල්පත- රු. 24812.50

36. එම්.බී. නාමල් ලක්රුවන්, නාමල් කන්ස්ට්‍රක්ෂන්, ගෝණදෙනිය
උඩුගම උප මහජන ක්‍රීඩාංගණය ජේ.සී.බී. යන්ත්‍ර යොදා සංවර්ධනය කිරීම
වෙනුවෙන් ගෙවීම - රු. 15000.00

**37. එස්.ඩබ්.සී.ප්‍රියදර්ශනී මිය, උඩුගම**
**සංවර්ධන ගම්මානය කන්ද පාර ජේ.සී.බී. යන්ත්‍ර යොදා සංවර්ධනය කිරීම**
වෙනුවෙන් ගෙවීම - රු.100000.00

**38. එච්. ඒ.කේ. වීරසේන මයා, වළකුඹුර**

සංවර්ධන ගම්මානයට ප්‍රෙවිශවන ස්ථානයට කොන්ක්‍රීට් දමා අළුත්වැඩියා කිරීමේ
කර්මාන්තයට අදාළ බිල්පත පියවීම - රු. 23204.00

<u>රජයේ ආධාර කර්මාන්ත</u>

**39.ඒ. කේ. ජානක ගයාන් සංජීව, ගයාන් එන්ටර්ප්‍රයිසස්, යටලමත්ත**

i. කැප්පිටියාගොඩ පඹේදෙණිය මාර්ගය සංවර්ධනය කිරීම සඳහා ජේ.සී.බී. යන්ත්‍ර යොදවා ගැනීමේ බිල්පත පියවීම මීටර් පැය 10 - රු. 25000.00

**40.කුරුපනාව ග්‍රාම සංවර්ධන සමිතිය,**
මයියොක්කාහේන මාර්ගය උඩලමත්ත දක්වා කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තයේ
10% ක රැඳවුම් මුදල් නිදහස් කිරීම - රු. 89236.20

**41.උඩලමත්ත උතුර ග්‍රාම සංවර්ධන සමිතිය**
උඩලමත්ත විල මාවත පළමු පටුමග කොන්ක්‍රීට් කිරීම කර්මාන්තයේ 10% රඳවුම් මුදල් නිදහස් කිරීම. -රු.128599.12

**42.උඩුගම උතුර ග්‍රාම සංවර්ධන සමිතිය**

i. උඩුගම බස්නැවතුම්පොළ උඩුමහලේ කඩකාමර සඳහා වැසිකිලියක් ඉදිකිරීම කර්මාන්තය I අදියර 10% රඳවුම් මුදල් නිදහස් කිරීම - රු. 31708.42
ii. උඩුගම බස්නැවතුම්පොළ උඩුමහලේ කඩකාමර සඳහා වැසිකිලියක් ඉදිකිරීම කර්මාන්තය II අදියර 10% රඳවුම් මුදල් නිදහස් කිරීම - රු. 18311.70

<u>මන්ත්‍රී ප්‍රතිපාදන</u>

<u>ගරු මන්ත්‍රී සුමනසිරි ලියනගේ මැතිතුමා</u>

**43. අතුකෝරල ඉලෙක්ට්‍රිකල්ස්, පිටිගල**
CFL බල්බ් මිළදී ගැනීම වෙනුවෙන් බිල්පත පියවීම - රු. 49720.00

**ඉදිරි ගෙවීම් වාර්තාවේ 34 අංකය යටතේ ඇති ගෙවීම පිළිබඳව අදහස් දක්වමින් ,ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා කියා සිටියේ නැවත තාක්ෂණ නිලධාරී වාර්තාවක් ලබා ගෙන ගෙවීම් කිරීම සුදුසු බවයි.**

**ඉදිරි ගෙවීම් වාර්තාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් යෝජනා කල අතර ගරු මන්ත්‍රී විලේගේ අමර ධනංජය මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය**

16.2019 වර්ෂයට නාගොඩ ප්‍රාදේශීය සභාවට අය උඩුගම, තල්ගස්වල, උනන්විටිය සති පොළවල් ටෙන්ඩර් කිරීමට අදාලව දැන්වීම් පුවත්පතේ පළ කිරීම සඳහා යෝජනා කරමි.
**මෙම දැන්වීම ගරු සභාපතිතුමා විසින් කියවනු ලදුව එම යෝජනාව ගරු උප සභාපතිතුමා විසින් ස්ථිර කරන ලද අතර ඒකමතිකව සභා සම්මත විය.**

17. නාගොඩ ප්‍රාදේශීය සභාවේ අයවැය කෙටුම්පත - 2019 සභාවට ඉදිරිපත් කිරීම

**ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් යෝජනා කල අතර ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය**

18. විදුමුතු පෙර පාසලේ උත්සවයක් සඳහා උඩුගම බහු කාර්ය ගොඩනැගිල්ල රු. 6000.00 කට ලබාදීමට යෝජනා කරමි.

**ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමා විසින් යෝජනා කල අතර ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය**

- **8.2 කර්මාන්ත යෝජනා**

**ගරු දකුණු පළාත් මන්ත්‍රී නලින් හේවගේ මැතිතුමා විසින් ඉදිරිපත් කරන යෝජනා**

**I.** නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වීති පහන් නඩත්තුව සඳහා රු. 30,000.00

**ගරු දකුණු පළාත් මන්ත්‍රී සුමනසිරි ලියනගේ මැතිතුමා විසින් ඉදිරිපත් කරන යෝජනා**

**II.** උඩුගම දකුණ මිනිරන්වල කන්ද ජේ.සී.බී. යන්ත්‍රක් යොදා පතිසංස්කරණය කිරීම සඳහා රු. 30,000.00

**8.3. ගරු සභාපතිතුමන් හා මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන යෝජනා**

**8.1 ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩ විතාන මහතා ඉදිරිපත් කරන පරිපාලන යෝජනා.**

I. 1988 ප්‍රාදේශිය සභා මූල්‍ය හා පරිපාලන රීති 203 වගන්ති ප්‍රකාරව සභාවේ භාණ්ඩ , උපකරණ වාහන හා වෙනත් වත්කම් පිළිබඳ පූර්ණ සමීක්ෂණයක් කිරීම සඳහා සභාවේ නියෝජිතයින් , සභාවේ නිලධාරීන් හා පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ නිලධාරියකු යන අයගෙන් සමන්විත සමීක්ෂණ මණ්ඩලයක් පත් කල යුතුයි.

**II.** සභාවෙන් පාලනය වන පෙර පාසල්, ආයුර්වේද මධ්‍යස්ථානය, පුස්තකාලය, කොම්පෝස්ට් අංගනය, ප්‍රධාන කාර්යාලය, යන ස්ථානවල ඉන්වෙන්ට්‍රි පොත්, තොග පොත් හා වෙනත් ලේඛන හා පොත් අනුව ශේෂයන් සත්‍යායනයේදී ඔවුන් විසින් නිරීක්ෂනය කරන ලද දේවල් සමග සසඳමින් ජනවාරි 15 දින වන විට භාණ්ඩ සමීක්ෂණ කටයුතු භෞතිකව අවසන් කර ඒ පිළිබඳව සභාවට උපදෙස් දීම සඳහාත් සංයුතිය 03 කින් යුත් වග කිව යුතු කාරක සභාවක් පත් කිරීමට යෝජනා කරමි**.**

III. නාගොඩ ඉහළ මුලන 216 ග්‍රාම නිලධාරී වසමේ අන්නාසිගලහේන අතුරු මාර්ගය ජේ.සී.බී. යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම

IV. කුරුපනාව අංක 216 මරණාධාර සමිති ශාලාව අසළින් ආරම්භ වී උඩලමත්ත කිරි මධ්‍යස්ථානය ළඟින් අවසන් වන මාර්ගයේ මැද කොටස ජේ.සී.බී. යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම

V. 2018 වර්ෂයේ ඉදිරි මාස සඳහා තැපැල් ගාස්තු වශයෙන් රු. 5000.00 ක මුදලක් වෙන් කිරීම

**ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනා ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රී පී.ජී. රංජිත් ජයවීර මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

I. අප බල ප්‍රදේශය වන තල්ගස්වල දියවර ගම්මානයේ පැති මාර්ගයේ ඇති කාණු පද්ධතිය නොමැති වීම හේතුවෙන් එම මාර්ගයේ ජලය බැස යාම අපහසුය. එම නිසා සමීර මහතාගේ නිවස අසළ සිට මානෙල් මහත්මියගේ නිවස දක්වා, කාණු පද්ධතිය වැසී ගොස් ඇත. තවද බෝක්කු නොමැති වීම එම මාර්ගය යටවීමට හේතුවයි. එම නිසා ඉතා ඉක්මණින් මෙම කාණු පද්ධතිය ස්ථාපිත කර දීම

II. අප බල ප්‍රදේශය වන කුඹුරුහේන 215 බී අලුත් පහළ බටහිර ගම්මානයේ ඇති ප්‍රධාන මාර්ගයේ අඳුරු ප්‍රදේශ සඳහා වීථි ලාම්පු 07 ක් ලබා දීම

III. 215 බී අලුත් පහල බටහිර නො. 20 ප්‍රදේශයේ මාර්ගය අබලන් වීම හේතුවෙන් එම මාර්ගයට කොරි පස් ටිපර් 05 ක් ලබා දීම

**ගරු මන්ත්‍රී පී.ජී. රංජිත් ජයවීර මහතා විසින් කරන ලද යෝජනා ගරු මන්ත්‍රිනී අරුණ ශාන්ති මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රිනී බී.ජී. අරුණ ශාන්ති මහත්මිය විසින් ඉදිරිපත් කරන යෝජනා**

I. අප ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු කම්කරු මහත්ම මහත්මීන්ට අමතර සේවා සඳහා අතිකාල දීමනා ගෙවීම

II. දකුණු පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් සහය ලබා අප ප්‍රදේශය තුළ ඇති ප්‍රධාන වාරිමාර්ග පද්ධති පුළුල් කිරීම

III. ගෝණදෙනිය කුරුපනාව තේ කම්හල පාරේ වසන්ත ගනේවත්ත මහතාගේ නිවස අසළ සිට නව වාඩියකන්ද මාර්ගයට ප්‍ර වේශ වන මාර්ගය ප්‍රාදේශීය සභා මාර්ගයක් ලෙස පවරා ගැනීම

**ගරු මන්ත්‍රිනී බී.ජී. අරුණ ශාන්ති මහත්මිය විසින් කරන ලද යෝජනා ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**9. කාරක සභා වාර්තා**

**9.1 ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම**

දකුණු පළාත් සංවර්දන සැළැස්ම - 2018 පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන -
ප්‍රජා ජල සම්පාදනය උඩුගම පුසුතකාලය ජල සැපයුම හා සනීපාරක්ෂක වැසිකිලි පද්ධතිය
ස්ථාපිත කිරීම රු. 1,300,000.00

**ඉහත ඇස්තමේන්තු ගරු උප සභාපතිතුමා විසින් යෝජනා කල අතර ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා විසින් ස්ථිර කරන ලදී.**

**9.2 මිළ ගණන් ඉදිරිපත් කිරීම**

**පෙර පාසල් අධ්‍යාපනය අවසන් කල සිසුන් සඳහා ලබා දෙන සහතික පත්‍ර මුද්‍රණය සඳහා ලැබී ඇති මිළ ගණන්**

| විස්තරය | අතුකෝරල ප්‍රින්ටර්ස්, පිටිගල | චන්දිම ප්‍රින්ටර්ස්, ඇල්පිටිය | කෙත්සිරි කමියුනිකේෂන් ඇන්ඩ් ප්‍රින්ටර්ස්, තල්ගස්වල |
|---|---|---|---|
| පෙර පාසල් අධ්‍යාපනය අවසන් කල සිසුන් සඳහා ලබා දෙන සහතික පත්‍ර මුද්‍රණය - එක් සහතිකපත්‍රයක් මුද්‍රණය සඳහා වැය වන මුදල (අයිවරි බෝඩ් යොදා වර්ණ 04 කින් යුක්ත ) | රු. **42.50** | රු.**40.00** | රු.**36.75** |

**අඩුම මිළ ගණන් ඉදිරිපත් වී ඇත්තේ කෙත්සිරි කමියුනිකේෂන් ඇන්ඩ් ප්‍රින්ටර්ස්, තල්ගස්වල වෙතිනි. එම යෝජනාව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථීර කරන ලදුව කෙත්සිරි කමියුනිකේෂන් ඇන්ඩ් ප්‍රින්ටර්ස්, තල්ගස්වල වෙතින් මුද්‍රණය කර ගැනීමට ඒකමතිකව තීරණ විය.**

**10.** ලැබීම් හා ගෙවීම් වාර්තා

**ලැබීම් හා ගෙවීම් වාර්තා ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා විසින් යෝජනා කල අතර ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් ස්ථිර කරන ලදී.**

**11.**වෙනත් කරුණු **:-**

**ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, 2018 වර්ෂය අවසන් වෙන්න තියෙන්නේ තව දින 48 යි. නමුත් මාපලගම බස් නැවතුම්පොලේ වැසිකිළිය ඉදි කිරීම තවමත් ආරම්භ කරලා නැහැ. එහි කටයුතු කඩිනමින් ආරම්භ කරන ලෙස ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මොකද වර්ෂය අවසානයේ මේ මුදල් ආපහු යනවා. එහෙම මුදල් ආපසු ගියොත් අපට නැවත වතාවක් මුදල් ලබාගන්න බැරි වේවි. ඒ වගේම ගරු

සභාපතිතුමනි, තල්ගස්වල සවිකර තිබුණු වීජී පහන් අලුත්වැඩියා කර සවිකිරීම සඳහා ගලවගෙන ආවා. නමුත් අලුත්වැඩියා කරලා නැවත සවි කරල තියෙන්නෙ වීජී ලාම්පු දෙකක් අඩුවෙන්. මේ කරුණු පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන ලෙස ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිමින්, මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු මන්ත්‍රිනී කේ.කේ.අයි. නෙරංජලී මහත්මිය**

ගරු සභාපතිතුමාගෙන්ද, ලේකම්තුමිය ඇතුළු මන්ත්‍රීතුමන්ලාගෙන්, මන්ත්‍රීමියන්ලාගෙන් අවසරයි. මම මේ අවස්ථාවේ නැගී සිටියේ අපේ උඩවැලිවිටියේ පිහිටි ප්‍රජා ශාලාවේ යතුර තිබෙන්නේ කවුරු ලඟද කියලා දැනගන්න අවශ්‍යයි. පසුගිය දිනක වැඩිහිටි සමිතිය පවත්වන්න ගිහිල්ලා ශාලාවේ දොර ඇරගන්න විදිහක් නැතුව විශාල අපහසුතාවයකට පත්වුණා. ඒ නිසා මේ යතුර තියෙන්නේ කවුරු භාරයේ ද කියලා දැනගන්න කැමතියි. ඒ අවස්ථාවේදී කිහිපදෙනෙකුගෙන්ම සොයා බැලුවත්, යතුරු සොයා ගන්න බැරි වුණා. ඒ නිසා වැඩිහිටි සමිතිය පවත්වන්න බැරිවුණා. ඒ වගේම ගරු සභාපතිතුමනි, මම පසුගිය සභාවාරයේදී ප්‍රකාශ කළ පාරේ තියෙන මාන පඳුරු ටිකවත් ගලවලා දෙන්න. ඒ පාර අපට සුද්ද කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රිනී එච්.එච්. ගයන්ති කුමාරි මහත්මිය**

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත මන්ත්‍රී මණ්ඩලයෙන් හා ලේකම්තුමියගෙන්ද අවසරයි. පසුගිය දිනක උඩුගම ප්‍රදේශයේදී කාන්තා සමිතිය ප්‍රතිසංවිධානය කිරීම සිදුවුණා. ඒ අවස්ථාවට මමත් සහභාගි වුණා. එහිදී ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල හා උඩුගම ප්‍රදේශයේ අයාලේ යන ගවයින් පිළිබඳව කතා කළා. මට තමයි ඒ ප්‍රශ්නය ඉදිරිපත් කළේ. මේ සම්බන්ධව ගෙන ඇති පියවර මොකක්ද කියලා මගෙන් ඇහුවා. ඒ වගේම, ඔබතුමා මේ සම්බන්ධයෙන් දැනුවත් කරන්න කියලා මගෙන් ඉල්ලීමක් සිදු කළා. ඒ පිළිබඳවත් ඔබතුමාට සිහිපත් කරමින්, මගේ බාප්පාගේ මළගම වෙනුවෙන් සහභාගී වූ සියලු දෙනාටම ස්තුතිවන්ත වෙමින්, මා නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු මන්ත්‍රී අමර ධනංජය විලේගේ මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සභාවෙන් අවසරයි. පසුගිය දිනවල මම හිටියේ හඟරන්වල ප්‍රදේශයේ, වතු ආශ්‍රිතව. එහි යම්කිසි පරිසර හානියක් සිදුවෙනවා. නුවරඑළියෙන් ගේන ගොම වලට රසායනික ද්‍රව්‍යයක් එකතු කරල නාකියාදෙණිය ඔයිල් ෆාම් කර්මාන්තශාලාවෙන් ඉවත දමන ඔයිල් ෆාම් රොඩු සමග මිශ්‍රකර පොහොර විදිහට ඉඩම්වලට යොදනවා. මේ ගොම වලට මිශ්‍ර කෙරෙන රසායනික ද්‍රව්‍යය මොන වගේ දෙයක්ද කියලා අපි දන්නේ නැහැ. වර්ෂා කාලයේදී මේවා සෝදගෙන ඇවිත් ඇළදොළ වලට මිශ්‍ර වෙනවා. ඒක නිසා මේ පිළිබඳ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් යොදවලා සොයා බලන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ වගේම ගරු සභාපතිතුමනි නාකියාදෙණිය තියෙන රබර් ෆැක්ට්‍රිය විශාලම කර්මාන්තශාලාවක්. ඒක දැන් වහලා දාලා තියෙන්නේ. නිෂ්පාදන කටයුතු සිදු කරන්නේ නැහැ. කර්මාන්තශාලාවේ යන්ත්‍ර සූත්‍ර දිරාපත් වෙමින් තියෙනවා. දැනටත් මේකෙ සේවකයෝ දාහතර දෙනෙක් කටයුතු කරනවා. ඒ සේවකයනුත් ඉවත් කිරීමේ උත්සාහයක් තියෙනවා. දැනට මෙම කර්මාන්ත ශාලාව යොදාගන්නේ නුවරඑළියෙන් ගේන ගොම ගබඩා

කරන්න. ඒ නිසා එම කර්මාන්ත ශාලාව නැවත ආරම්භ කිරීමට හෝ පවරා ගැනීමට සුදුසු වැඩපිළිවෙළක් සභාව මගින් ගන්නා ලෙස ඉල්ලා සිටිනවා. ස්තුතියි.

**ගරු මන්ත්‍රී එම් එම් දිසානායක මහතා**

ගරු සභාපතිතුමනි, සියලුම මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. මට තියෙන්නේ උනන්විටිය පොලේ කුණු අස් කරන්නේ නැති ප්‍රශ්නය පිළිබඳව දැනුවත් කරන්න. උනන්විටිය පොලේ නියමිත පරිදි එකතුවන කුණු ඉවත් කරන්නේ නැහැ. ඒ පිළිබඳව ගමේ මිනිසුන් උද්ඝෝෂණයක් කරන්න මගෙන් ඇහුවා. මේ පොළ පැවැත්වෙන්නේ අඟහරුවාදා දින. එදාට එකතුවන කුණු ටික අස් කරන්නේ ඊළඟ සතිය සඳුදා නැත්නම්, අඟහරුවාදා උදේ. ඒ වෙනකොට මේවා කුණුවෙලා ගඳ ගහනවා මැස්සෝ බෝවෙනවා පාරෙවත් යන්න බෑ අවට මිනිස්සු අපහසුතාවයට පත් වෙනවා. ඒ වගේම පොළට පිවිසෙන මාර්ගය අබලන් වී ඇති බැවින් සකස් කර දෙන ලෙසත් ඉල්ලා සිටිනවා. ඒ නිසා මේ පිළිබඳව සොයා බලා කටයුතු කරන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා ඒ වගේම ගරු සභාපතිතුමනි මම ඉදිරිපත් කරන ලද අක්කර 2 පාර ඉතාම අබලන් වී ඇති බැවින් ප්‍රතිසංස්කරණය කර දෙන ලෙස ඉල්ලා සිටිමින් නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී පී.ජී. රංජිත් ජයවීර මහතා**

ගරු සභාපතිතුමනි, අපේ පක්ෂයේ නිර්මාතෘ රෝහණ විජේවීර සහෝදරයාගේ විරු දින උත්සවය කොළඹදී පැවැත්වෙනවා. ඒ වගේම ගරු සභාපතිතුමනි, තල්ගස්වල දියවරගම්මාන ප්‍රදේශයේ කුඩා වැස්සක් වැස්සත් පාර යටවෙනවා. මේ සම්බන්ධව ධර්මසිරි මන්ත්‍රීතුමාත් දන්නවා. පසුගිය දවසක ඒ ප්‍රදේශයේ මල ගෙදරක් තිබුණා. වර්ෂාව නිසා පාර යටවෙලා. මිනීපෙට්ටිය ගෙනියන්නවත් බැරි වුණා. එම ස්ථානයේ ඉණ වටක් වතුර පිරෙනවා. ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි, ගයාන් මන්ත්‍රීතුමා පසුගිය සභාවේ දී කතා කළ, මාපලගම කොළඹකඩේ අසල ජයතිස්ස අබේසුන්දර මහත්මයාගේ නිවස ඉදිරිපිට තියෙන වතුරවල. මේ කාරණය අපි සම්බන්ධීකරණ කමිටුවේ කතා කළා. ඒත් වැඩක් වුණේ නැහැ. ළමයෙකුට ඇඳුමක් ඇඳගෙන සපත්තු දාලා පාසල් යන්න විදියක් නැහැ. මේ දියවර ගම්මානයේ පාර යට වෙන එක පිළිබඳව මීට පෙර සභාවකදී කතා කලා. මේ කානු සකස් කරලා දෙන්න කියලා ඉල්ලීම් කලා. ඒ නිසා මේ පිළිබඳ ව අවධානය යොමු කර ඒ කාණු ටික සකස් කරල දෙන්න කියල ඉල්ලා සිටිනවා. තව කාරණයක් තමයි, ගවයන්ගෙ ප්‍රශ්නෙ අපේ ප්‍රදේශයේත් එම ප්‍රශ්නය බහුලව තියෙනවා. වගා කර ගෙන කන්න කිව්වට මේ අයාලේ යන ගවයන් නිසා වගා කරන්න විදියක් නැහැ. මේ සම්බන්ධව කඩිනම් පියවරක් ගන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, මාපලගම වැසිකිලිය එම ස්ථානයට අතවශ්‍යම දෙයක්. මේ සම්බන්ධ දේශපාලන ප්‍රශ්නයක් තියෙන බව කිව්වා. ඒ කොහොම වුණත් කෙසේ හෝ එම ප්‍රශ්නය නිරාකරණය කරගෙන ඉක්මනින් වැසිකිලිය ඉදිකිරීමේ කටයුතු ආරම්භ කරන ලෙස ඉල්ලා සිටිනවා. ඒ වගේම කුඹුරුහේන ප්‍රදේශයට වීථි ලාම්පු දෙන්න කියලා කීප අවස්ථාවකදීම ඉල්ලීම් කළා. නමුත් තාම ලැබුණේ නැහැ. මන්ත්‍රී ප්‍රතිපාදන වලින් වීථි ලාම්පු අලුත්වැඩියා කරන්න යම් මුදලකුත් ලැබිලා තියෙන නිසා ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරලා, අපට වීදි ලාම්පු ලබාදෙන ලෙස ඉල්ලා සිටිනවා. ඒ වගේම ගරු සභාපතිතුමනි, කඩිනමින් අවධානය යොමු කල යුතු තවත් ප්‍රශ්නයක් තියෙනවා. ඇතුමලේ පුස්තකාලයේ

වහල ප්‍රතිසංස්කරණය කළාට, තවමත් තෙමෙනවා. මම ගිහිල්ලත් බැලුවා. ධර්මසිරි මන්ත්‍රීතුමන්ලා වහල හැදුවට ඒක හරි ගිහිල්ලා නැහැ. ඒ වගේම ඒකේ තියෙන පුටු කැඩිලා. ලණුවලින් ගැට ගහලා තමයි තියෙන්නේ. ඒවායේ වාඩි වෙන්නත් බයයි. ඒ නිසා මේවා යථා තත්ත්වයට පත් කරන්න ඉක්මනින් පියවර ගන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ වගේම ගරු සභාපතිතුමනි, ආයුර්වේදයට තවම වෛද්‍ය නලාව අරගෙන දීලා නැහැ. මම හොයලා බැලුවා, රුහුණු වෛද්‍ය පීඨයේ රුපියල් 17000.00 කට නලාවක් තියෙනවා. ඒක වෛද්‍ය පීඨයෙන් ගන්න පුළුවන්. ඒ ගැනත් ඔබතුමාගේ අවධානය යොමු කරලා අවශ්‍ය උපකරණ ලබා දෙන්න කියලා ඉල්ලා සිටිමින් සියලු දෙනාට සුබ දවසක් වේවා යි ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය**

ගරු සභාපතිතුමා, ලේකම්තුමිය ඇතුළු සියලු මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. අපේ දකුණු පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය, ෂාන් ඇමැතිතුමා, ආගමික උත්සව පිළිබඳ තොරතුරු ඉල්ලලා තියෙන්නෙ. ඇත්තටම එතුමා යමක් කරන්න හිතලා තමයි. ඒක ඇත්තටම හොඳයි. ඒක නිසා ඒ තොරතුරු අපි ලබාදෙන්න ඕන. ඒ වගේම තමයි මම හැමදාම සභාවේ කතාකරනවා ලයිට් ප්‍රශ්නය ගැන. ඒ අවස්ථාවේදී කරල දෙන්නම් කියල කියනවා. ඒ නිසා ලබන මාසෙවත් ඒ කටයුතු ටික කරලා දෙන්න කියලා ඉල්ලනවා. සභාපතිතුමා යටලමත්ත ගැන සොයා බලන නිසා, ලබන මාසෙ වන විට ලයිට් ටික හයිකරලා තියේවි කියලා මම විශ්වාස කරනවා.

ඒ වගේම තමයි අර දිසානායක කඩේ ඉස්සරහ කුණු කන්දක් තියෙනවා. ඒ ගැන අපිටත් කිව්වා. මම කිව්වා සභාවේ වාහනය ආව නේද කියලා. එතුමා එතකොට ප්‍රකාශයක් කළා, එම කුණු නොගෙනිච්චොත් සභාවට ගෙනත් දානවයි කියලා. ඒ අවස්ථාවේදී මම කිව්ව සභාවෙන් ඇවිත් ඔය කුණු ටික අරන් යාවි ඒ නිසා ඒක කරන්න එපා කියලා. ඒ මනුස්සයා ඒ කුණු ටික එතනට දැම්මේ සභාවෙන් කුණු අස් කලාට පස්සේ.

ඒ වගේම තමයි පන්සල පාරෙ අනතුරුදායක ඉඹුල් ගහක් තියෙනවා. ඒක වැටුනොත් විශාල විනාශයක් සිදුවෙනවා. ඒක නිසා ඒ ගසත් ඉවත් කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා. ඒ වගේම ඉස්සර අපේ ගම්වල ශ්‍රමදාන තිබුණා. දැන් එහෙම නැහැ. දැන් පාරේ වතුර වලක් තිබුණත් කියන්නේ සභාවට, ඉස්සර ශ්‍රමදාන මට්ටමින් සකස් කර ගන්නවා. මම හිතන්නේ, සභාවේ මුදල් නැති නිසා ගම්වල මේ පොඩි පොඩි දේවල් එකමුතුවෙලා කරගන්නවනම් සභාවට ඒක ලොකු හයියක් වෙනවා. ඒ වගේම සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරුන්ට ඉදිරි මැතිවරණය සාර්ථකව කරගන්න ශක්තිය, ධෛර්යය ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. සියලු දෙනාටම තෙරුවන් සරණයි.

**ගරු මන්ත්‍රිනී බී.ජී. අරුණ ශාන්ති මහත්මිය**

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත මන්ත්‍රීතුමන්ලාගෙන් අවසරයි. මම යෝජනා තුනක් ගෙනාවා.

මගේ පළවෙනි යෝජනාව සභාවේ සේවය කරන සේවක සේවිකා මහත්ම මහත්මීන්ට අතිකාල දීමනා ගෙවන්න කියන එක. අපේ කම්කරුවන්ට සෙනසුරාදා, ඉරිදා, පෝය දින වල වැඩ කළාම හිලව් ගෙවීමක් කරනවා කියලා තමයි එතුමන්ලාගෙන් දැනගන්න ලැබිලා

තියෙන්නෙ. ඒ දිනවලට හිලව් ගෙවනවාට වඩා අතිකාල දෙනවා නම් හොඳයි කියලා තමයි ඒ අය ප්‍රකාශ කරන්නේ. ඒක නිසා තමයි මම මේ යෝජනාව ගෙන ආවේ. අපි කවුරුත් චෝදනා කරන්නේ එතුමන්ලා වැඩ කරන්නේ නැහැ කියලා. ඒ නිසා අපෙනුත් ඒ අයට ඉටුවිය යුතු යුතුකම් කරලා, එතුමන්ලාගේ සේවය ලබාගනිමු. අධීක්ෂණ නිලධාරියෙක් වැඩබිමට යොදවනවා නම් හොඳයි කියන එක තමයි මගේ අදහස. බඳවා ගැනීමේ පටිපාටියක් ඇති. ඒ අනුව ගෙවන්න පුළුවන් නම් ගෙවන්න කියලා ඉල්ලා සිටිනවා.

මගේ දෙවැනි යෝජනාව, දකුණු පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව දැනුවත් කරලා අපේ ප්‍රදේශවල තියෙන වාරි මාර්ග පුළුල් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. මොකද සුළු වර්ෂා තත්වයක් ඇතිවුනත් අපේ ප්‍රදේශ ක්ෂණිකව යටවෙනවා. ඒ නිසා මම හිතන්නේ අපේ සභාව හරහා දකුණු පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව දැනුවත් කරනවා නම් හොඳයි කියලා මම හිතනවා.

මම තව යෝජනාවක් ගෙනාවා. අපේ ගෝණදෙනිය කුරුපනාව තේ කම්හල පාර වසන්ත ගනේවත්ත මහතාගේ නිවස අසල සිට  වාඩියකන්ද මාර්ගයට ප්‍රවේශ වන මාර්ගය ප්‍රාදේශීය සභා මාර්ගයක් ලෙස පවරා ගන්න කියලා. එම යෝජනා තුන තමයි මට ඉදිරිපත් කරන්න තියෙන්නේ.

ඒ වගේම අපේ ගයන්ති මන්ත්‍රීතුමිය නිතරම කතා කලා. අපේ කොම්පෝස්ට් අංගනය අසල තියෙන නිවාස වලට මැස්සන්ගෙන් තිබෙන කරදරය ගැන. ඇත්තටම අපි පසුගිය දවසක  එම ප්‍රදේශයට ගිය විට ඒ සිද්ධිය දැක්කා. ළමයෙකුට කෑම කවන්නවත් බැරි තත්වයක් උදාවෙලා තියෙන්නේ. මැස්සන් ඉන්නවා, ඒ වගේම හරියට ගඳ ගහනවා.  ඒ මිනිස්සු ඉන්නේ ඉතා අපහසු තත්වයකින්. ඒ නිසා මේ පිළිබඳව අවධානය යොමු කරලා යම් වැඩපිළිවෙළක් යොදනවා නම් හොඳයි.

ඒ වගේම හැමෝම කියනවා වගේ  ලයිට් ප්‍රශ්නය මටත් තියෙනවා. ඉතින් මම සභාපතිතුමා නිතරම දැනුවත් කරනවා. ඒත් තාම පිළිතුරක් ලැබිලා නැහැ. ඉතින් මම මෙවර විතරයි ඒ ප්‍රශ්නෙ ගැන කතා කරන්නේ. මම සභාවට ආපු දවසේ ඉඳලම මේ ප්‍රශ්නෙ ගැන කතා කරනවා. ඒ නිසා අවසාන දවස වශයෙන් තමයි අද ඒ  ගැන කතා කරන්නේ. සියලු දෙනාට ස්තුති කරමින් මා නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය**

ගරු සභාපතිතුමනි, අවසරයි. මම මීට පෙර සභා වාර කීපයකදී ම නාගොඩ පර්යන්ත රෝහලේ තිබෙන අඩුපාඩු පිළිබඳව කිව්වා. ඒ සේවකයින් මා වෙත දැනුම් දීමක් කළා. මම සභාවෙදී ඒ පිළිබඳ ඉදිරිපත් කිරීම් කළා. මේ වනතෙක්ම ඒ සම්බන්ධව කිසිදු කාර්යයක් සිදු වෙලා නැති බව දැනගන්න ලැබුණා. කම්කරුවෝ ටිකක් හරි එතනට යොදවලා රෝහලේ තියෙන කුණු කසළ ටික ඉවත් කර ගැනීමේ කටයුත්තට සම්බන්ධ වෙන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම වලකුඹුර ළිඳ පිළිබඳව මේ වාර්තාවෙ සඳහන් වෙලා තියෙනවා. දැන් ඒ ළිඳේ ගැටළුවක් නැති බව ගරු මන්ත්‍රිනි ප්‍රියන්තා ගුණසේකර මහත්මිය ප්‍රකාශයට ලක්කරලා තියෙයි කියලා තමයි වාර්තාවෙ තියෙන්නෙ. නමුත් ඒ ළිඳ පිළිබඳව මේ ප්‍රකාශය ගැන මම ඒ

අවස්ථාවේ මේ සම්බන්ධ ඉදිරිපත් කිරීමක් කළේ නැහැ. ඒ උනාට ළිඳ පිළිබඳව පොඩි පොඩි ප්‍රශ්න ටිකක් තියෙනවා. කම්කරුවො ටිකක් යොදවලා ඒ ළිඳ ඉසින්න කටයුතු කරන්න. ළිඳ ඇතුලේ පස් වගයක් තියෙනවා. ඒ ටික ඉවත් කරලා දෙන්න කියලා මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ස්තුතියි.

**ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා**

ගරු සභාපතිතුමනි, සියලුම මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා, ලේකම්තුමිය ඇතුළු සියළු දෙනාගෙන් අවසරයි. සභාපතිතුමනි, දීර්ඝ කාලයක් තිස්සේ මාපලගම නගරයේ වීථි ලාම්පු ටික අලුත්වැඩියා කරල දෙන්න කියල ඉල්ලීම් කළා. මේ පහුගිය දින කීපයකට උඩදී වීථි ලාම්පු ටික අලුත්වැඩියා කරලා සවි කරල තිබුණා. ඒ පිළිබඳ සභාපතිතුමාට ස්තුතිය ප්‍රකාශ කරනවා. ඒවගේම තමයි ඊළඟට තියෙන ප්‍රශ්නය, මාපලගම බස් නැවතුම්පොලේ වැසිකිළි පද්ධතිය ඉදිකිරීම පිළිබඳව. එදා සභාවේ දී ඔබතුමා කිව්වා. දේශපාලන ප්‍රශ්නයක් තියෙනවා කියලා. ඔබතුමා සභාපතිතුමා නිසා ඔබතුමාගේ බලතල පාවිච්චි කරලා මේක ක්‍රියාත්මක කරන්න කියල ඉල්ලා සිටිනවා. මේ අවුරුද්දෙ ඒ කටයුත්ත සිදු කරගන්න බැරි වීම සහ අපිට මුදල් ලැබිලා තමන්ගේ බලය පාවිච්චි කරලා සභාපතිතුමාට ඒ කටයුත්ත කරගන්න නොහැකි වීම පිළිබඳව අපි කණගාටු වෙනවා. මම හිතන්නේ ප්‍රාදේශීය සභාවේ සභාපති කියන්නේ ලොකු බලයක් තියෙන කෙනෙක්. දැන් ඉතින් කොහොම උනත් කමක් නැහැ. අපි ඉදිරි කාලයේදීවත් ඒ කටයුත්ත ඉෂ්ට කරගන්න බලාපොරොත්තු වෙනවා. මේ කාරණය මාපලගම මංසන්දියට අත්‍යවශ්‍යම කටයුත්තක් තමයි. එය ඉටුකරගන්න ජනතාවගේ විශේෂ ඉල්ලීමක් තියෙනවා.

ඒ වගේම දෙවැනි කාරණය හැටියට මම කණගාටුවෙන් ප්‍රකාශ කරනවා. මොකද ගම්පෙරලිය වැඩසටහන යටතේ අපේ නාගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සෑම ග්‍රාම නිලධාරි වසමකම ව්‍යාපෘති යෝජනා ඇස්තමේන්තු සකස් කරලා තිබුනෙ. ඒ වැඩ පටන් ගන්න අවස්ථාවයි තිබුනෙ. පසුගිය දින දෙකකට උඩදී අග්‍රාමාත්‍ය කාර්යාලයෙන් කියලා ලිපියක් එවලා ඒ සියලු වැඩ අතරමග නැවැත්තුවා. ප්‍රදේශයේ ජනතාවගේ දැඩි ඉල්ලීම මතයි ප්‍රදේශයේ ලක්ෂ 10 ලක්ෂ 15 සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කරන්න ඇස්තමේන්තු කරලා තියෙනවා. සමහර මාර්ගවලට අවශ්‍ය ගල්, වැලි ගිහින් දාලා ඒ සියල්ල සිදු කළාට පස්සේ, ඒ නිර්දේශ ක්‍රියාමාර්ග අරගෙන තියෙනවා. ඉතින් ඒ ගැන අපි කනගාටු වෙනවා. අපේ ප්‍රදේශයේ සංවර්ධනයට තිබුන අවස්ථාව නැති වුණා. පසුගිය කාලේ නම් යම් ව්‍යාපෘතියකට ඇස්තමේන්තු කරලා, ගිවිසුම්ගත වුනානම් ඒක කරන්න පුළුවන්කම ලැබුණා. ඒ වගේම පරණතානායම්ගොඩ ගල්වාන - උඩුගම පාරේ වීථි ලාම්පු කිහිපයක් අක්‍රිය වෙලා තියෙනවා. සභාපතිතුමනි, ගල්වාන හන්දියේ ලයිට් එක පත්තු වෙනවා. ඊට මෙහා තේක්කවත්ත, පාලුවත්ත හරියෙ වීථි ලාම්පු කිහිපයක් අක්‍රිය වෙලා තියෙනවා. ඒ ටික අලුත්වැඩියා කරලා දෙන්න කියලා ඉල්ලීමක් කරනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි ගොඩැල්ල වත්ත, ඇතුමලේ පසුගිය දවස්වල නායයෑමට ලක් වුණා . පවුල් තුනක් මේ වන විට එතනින් ඉවත් කරලා තියෙනවා. ඒ අයට දැන් දැඩි අසීරු තත්ත්වයකට පත් වෙන්න සිදු වෙලා තියෙනවා. ඉන්න හිටින්න තැනක් නැතිව, ඒ අයට

සාධාරණයක් නොවෙයි කියලා ඒ අය අදහස් කරගෙන ඉන්නවා. ඒ නිසා මේ සම්බන්ධව සම්බන්ධීකරණ කමිටුවේදී අදහස් දක්වන්න.

ඒ වගේම සභාපතිතුමනි අපි මේ වෙලාවේ විශේෂයෙන් මතක් කරන්න ඕන. 2015 ජනවාරි 8 වැනිදා මුළු ලංකාවෙම ලක්ෂ 62 ක ජනතාව පොදු අපේක්ෂකයෙක් හැටියට මෛත්‍රීපාල උන්නැහේ ජනාධිපති කළා. මේ වෙලාවේ ඒ ලක්ෂ 62 ජනවරමට පයින් ගහලා යම් ව්‍යවස්තා විරෝධී, ඒ වගේම ඉතාම නීච ක්‍රියාවලියකට අවතීර්ණ වෙලා තියෙනවා. අපි බොහොම ලස්සනට අවුරුදු තුනහමාරක් මේ රටේ යහපාලන ආණ්ඩුවක් පවත්වා ගෙන ආවා. යහපාලන ආණ්ඩුව තුළින් ජනතාවගේ බලාපොරොත්තු ඉටු කළා. විශේෂයෙන්ම කොමිෂන් සභා ගෙනැල්ලා රටේ ස්වාධීනව, රටේ නීතිය හා සාමය රකින වැඩපිළිවෙළක් සකස් කලා. හැබැයි නැවත 2015 ජනවාරි 8 වැනිදාට පෙර තිබුණු ඒ අඳුරු යුගයට මේ රට ගෙනියන්න, මේ වෙලාවේ මෛත්‍රීපාල උන්නැහේ ක්‍රියාත්මක වෙනවා. අවුරුදු 2500ක ඉතිහාසයක් තියෙන, බුද්ධාගම තියෙන රටක් හැටියට දිට්ඨධම්මවේදනීය කර්මය උන්නැහේට පලිසම් දේවි. මේ වෙලාවේ වැඩිපුර කරුණු කාරණා කියන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. සිද්ධ වෙන දේවල් සිද්ධ වේවි. අපේ ලක්රුවන් මන්ත්‍රීතුමා කිව්වා ඉදිරියේදී ඡන්දයකට යනවා කිව්වා. අපි මැතිවරණ වලට බය නැහැ. අපි ඕන වෙලාවක මැතිවරණයට ලේස්තියි. හොඳ ශක්තිමත් කණ්ඩායමක් හැටියට මැතිවරණයට ඉදිරිපත් වෙනවා. වැඩි පිරිසකගේ සහයෝගයෙන් පාර්ලිමේන්තුවේ බලය ගන්න අපට හැකියාව තියෙනවා. අපි ජනතාව විශ්වාස කරන වැඩපිළිවෙළක් පසුගිය අවුරුදු තුන හමාරක් තුල ක්‍රියාත්මක කලා. ජනතාව ඒ බව තේරුම් ගනීවි. 2015-01-08 පස්සේ ක්‍රියාත්මක වුණු පාලන ක්‍රමය ද, නැත්නම් ඊට පෙර ක්‍රියාත්මක වුණු අඳුරු යුගය ද කියලා තීන්දු තීරණ ගනිවී. ඊට එහා මුකුත් කතා කරන්නේ නැහැ. හැබැයි මේ වෙලාවේ මේ තීරණය පිළිබඳව මෛත්‍රීපාල සිරිසේන උන්නැහේට දැඩි සේ විරෝධය පළ කරනවා.

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත ලංකා මණ්ඩලයෙන් හා ලේකම්තුමිය ගෙන් අවසරයි. නෙරංජලී ගරු මන්ත්‍රීතුමිය, අපේ උඩවැලිවිටිය ප්‍රජාශාලාව පිළිබඳ මේ වෙලාවේ ඇහුවා. සභාවට ලැබුණු සම්පතක් හැටියට මේක ප්‍රාදේශීය ලේකම්තුමිය අපට ලබා දීලා මාස කිහිපයක් වෙනවා. ගොවි සංවිධානයට තමයි මේ ප්‍රජාශාලාව භාර දීලා තිබුනේ. ඔවුන් නිසියාකාරව පරිහරණය කිරීම හා නඩත්තු නොකිරීම නිසා මේ වන විට විදුලිය විසන්ධි කරලා තියෙනවා. දැනට හිඟ විදුලි බිල, සභාව මගින් ගෙවා සභාපතිතුමා මගින් විදුලිබල මණ්ඩලයට ලිපියක් යවලා, සභාවෙ නමට විදුලි බිල හරවගෙන නැවත විදුලිය ලබාගන්න කටයුතු කරන්න කියල මම ගරු සභාපතිතුමා ගෙන් ඉල්ලීමක් කරනවා. ඒ වගේම මන්ත්‍රීතුමිය කිව්ව වගේ ගමට තියෙන එකම ප්‍රජාශාලාව මේක. රැස්වීම් තියන්න, පොදු කටයුතු වලට හැමෝම සම්බන්ධ වන නිසා ඒකට සුදුසු වැඩපිළිවෙළක් යොදලා, සභාවේ සම්පතක් හැටියට යම් ආදායමක් ලබාගත හැකි පරිසරයක් තිබෙනවා. ඒ නිසා සභාවේ නිලධාරීන් යොදවලා, සුදුසු වැඩපිළිවෙළක් යොදවලා, විධිමත් පරිදි එකේ යතුර පරිහරණය කරන්න ක්‍රමවේදයක් යොදන්න කියලා ඉල්ලා සිටිනවා. මොකද මේක ජලය, විදුලිය,

වැසිකිළි සහිත අංගසම්පූර්ණ ස්ථානයක්. සභාවට නොමිලේම ලැබුණු දායාදයක්. පැවතුන සියලු රජයන්ගේ දායකත්වය ලබාගෙන අංගසම්පූර්ණව ඉදිකරලා තියෙනවා. ඒ නිසා මේ සම්බන්ධව අවධානය යොමු කරල කටයුතු කරනු ඇතැයි කියා මම විශ්වාස කරනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, ප්‍රදේශය පුරා විහාරස්ථාන ආශ්‍රිතව සහ ප්‍රධාන මාර්ගවල අයාලේ යන සුනඛයින් විශාල ලෙස වැඩි වෙලා තියෙනවා. මේක වසංගතයක් ලෙස පරිවර්තනය වෙලා තියනවා. ඒ නිසා ඉතා ඉක්මනින් සභාවේ අවධානය යොමුකර m.o.h. එකත් එකතු කරගෙන , සුනඛයින්ගේ බෝවීම වලක්වන්න වැඩපිළිවෙළක් සකස් කරන්න. මොකද පන්සල්වලින් විශාල ලෙස පැමිණිලි එනවා. ඒ වගේම වාහන වලට පොඩි බලු පැටව් යටවෙලා මැරෙනවා. සුනඛයින්ගේ ප්‍රශ්නය නිසා පන්සල්වල දහම්පාසල් පවත්වන්න විදිහක් නැහැ. ප්‍රදේශයේ ජනතාවත් මේ පිළිබඳව හිතන්නේ නැහැ. ලේසියට බල්ලන්, බළලුන් පන්සලට ගෙනත් දානවා. මේ සම්බන්ධව අපට වගකීමක් තියෙනවා. ඒ නිසා අපි නායකත්වය අරගෙන, m.o.h. එකත් එක්ක සම්බන්ධ වෙලා වැඩ පිළිවෙළක් සකස් කරන්න කියලා විශේෂ ඉල්ලීමක් කරනවා.

ඒ වගේම අපේ සභාව ගැන කතාකළාම, මේක කවුරුවත් වැරදි විදියට තේරුම් ගන්න එපා. ඇත්තටම සභාවේ නිලධාරීන් තමන්ට පැවරෙන කටයුතු නිසියාකාරව ඉටු කරනවා. ඒ ගැන කිසිම විවාදයක්, ගැටළුවක් නැහැ. නමුත් සමහර අවස්ථාවලදී අපි සභාවට ආවම පාලු ස්වභාවයක් දැනෙනවා. ඒ නිසා ඒ පිළිබඳව ගරු සභාපතිතුමාගේ, ලේකම්තුමියගේ අවධානය යොමු කර කටයුතු කරන්න. මම කියන්නේ, මගේ ගැන වැරදි අවබෝධයක් ඇති කරගන්න නෙවෙයි. පසුගිය දවස්වල යම් අවස්ථාවලදී යම් යම් දේවල් සිදු වුණාම මන්ත්‍රීවරුන්ට සභාවේ ඉන්න අයගේ කෙලින්ම ඇඟිල්ල දික් වෙච්ච අවස්ථා මම දැක්කා. ඒක නිසා සභාවේ මන්ත්‍රීවරු අපි කොයි වෙලාවකවත් සභාවෙ නිලධාරීන්ට අකුල් හෙළන්නේ නැහැ. තම තමන්ගේ හෘද සාක්ෂියට එකඟව අපි වැඩ කරන්න ඕන. ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු මොන පක්ෂය නියෝජනය කරල ආවත් අපට මහජනයා වෙනුවෙන් යමක් කරන්න පුළුවන් නම් ඒ දේ සිදු කිරීම අපේ යුතුකමක්. රජයේ වැටුපක් ලබන අය හැටියට හෘදසාක්ෂියට එකඟව තමන්ගේ යුතුකම් මොනවාද කියලා හඳුනාගෙන රාජකාරිය දේවකාරිය සේ ඉටු කිරීම යුතුකමක් වෙනවා. ඒ වගේම සමහර අවස්ථාවලදී මන්ත්‍රීවරුන්ට කෙලින්ම ඇඟිල්ල දික් වුන අවස්ථාවනුත් තිබුණා. මන්ත්‍රීවරයන්, නිලධාරින්, සේවකයන් සියලු දෙනා අතරේ අන්‍යෝන්‍ය සුහදත්වය සහ බැඳීම ඇති වෙන්න ඕන. මේ සියලු දෙනා සභාවේ එකම කණ්ඩායමක් හැටියට තමයි සැලකෙන්නේ. ඒක නිසා මොන මතිමතාන්තර තිබුණත් අපි එකා වගේ මේ ප්‍රාදේශීය සභාවේ වැඩකටයුතු කළ යුතුයි කියන මතක් කිරීම මේ වෙලාවේ සිදුකරනවා. මේ සභාවේ පහලම කම්කරුවාගේ ඉඳලා සභාපතිතුමා දක්වා මිනිසුන්ට ආත්ම ගරුත්වයක් තියෙනවා. ඒක රැකෙන පරිදි කටයුතු කරන්න අවස්ථාව තිබිය යුතුයි. ඒ නිසා එකිනෙකා අතර සුහදත්වය, බැඳීම තිබිය යුතුයි කියලා මම විශ්වාස කරනවා. නමුත්, ඒක දකින්න ලැබෙන්නේ නැහැ. මෙහෙම අපට ඉදිරි ගමනක් යන්නත් බැහැ. ඒ නිසා අපි මේවා හදාගන්න ඕන. මේවා කිව්වේ මම ගැන වැරදි අවබෝධයක් ඇති කරගන්න නෙවෙයි.

ඒ වගේම ගරු සභාපතිතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා. මගේ කොට්ඨාශයේ උඩවැලිවිටියේ පොදු අරමුදල් මගින් සිදුකිරීමට නියමිත උඩවැලිවිටිතලාව ගල්ලෙන මුල්ල මාර්ගයේ යාමට අපහසු තැන් වලට ගමේ අයගේ සහයෝගය අරගෙන, තාක්ෂණ නිලධාරි

මහත්මයාගේ අධීක්ෂණය යටතේ, කොරිපස් යෙදුවා. ඒත් ඒකෙ වැඩ අවසන් කරගන්න බැරි වුණා. ඉදිරි දින කීපයේදී ඒ කටයුතු අවසන් කරනවා. කර්මාන්තය අවසන් කළාම ගෙවීම් කරන්න ඊළඟ සභා වෙනකම් ඉන්න ඕනද, නැත්නම් ඊට කලින් ගෙවීම් කරන්න පුළුවන්ද කියලා දැනගන්න අවශ්‍යයි. ඒ වගේම මේ වෙලාවෙ රට තුළ යම් දේශපාලන වාතාවරණයක් නිර්මාණය වෙලා තියෙනවා. මේ දේශපාලන වාතාවරනය කෙලෙස නිර්මාණය වුවත්, අවසානයේ හැමදෙනාගෙම කුණු හෝදන කණ්ඩායමක් හැටියට පක්ෂ පාට භේදයකින් තොරව කවුරු මොන දේ කතා කළත්, ප්‍රාදේශීය දේශපාලනඥයින් හැටියට අපි තමයි සියලුම දේශපාලනඥයින් ගේ මේ කටයුතුවලදී පක්ෂ පාට භේදයකින් තොරව සෑම රජයක්ම පිහිටුවන්න බොහොම අමාරුවෙන් වෙහෙසකරව වැඩ කරන්නේ. මේ රටේ ඇති වුන ගැටළුව ශ්‍රේෂ්ඨාධිකරණයට යොමු කරලා තියෙනවා. එතනින් මොන තීරණයක් දෙයිද කියලා අපි දන්නේ නැහැ. මොන තීරණය දුන්නත්, අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා එක්ක අපි පෙළගැසෙනවා. ඒ වගේම අතිගරු ජනාධිපතිතුමා ගනිපු තීරණය ගැන මේ සභාවේ වචනයක් කතා කළ යුතුමයි. ජනාධිපතිතුමා එක පක්ෂයකට කොටුකරන්න බැහැ. ඡන්දයකින් පත් වූ කෙනෙක්. ඒ නිසා හැමෝටම පොදුයි. පසුගිය රජයේ ගරු අග්‍රාමාත්‍යතුමා සියලු බලතල ලබා දීලා කටයුතු කරන්න අවස්ථාව ලබාදී තිබුණා. ඒ බලතල පාවිච්චි කරලා නිසියාකාරව කටයුතු නොකරපු නිසා තමයි මේවගේ දෙයක් අත්විදින්න වෙලා තියෙන්නෙ. මම හොඳ උදාහරණයක් කියන්නම්, මේ වෙනකොට නාගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තට්ටු හතරෙ ගොඩනැගිල්ලක් හදනවා. මේක හදන්නෙ කිසිම ටෙන්ඩර් එකක් නොකැඳවා. එක කොන්ත්‍රාත්කරුවකු ට ලබා දී තියෙනවා. ඊලග එක බද්දෙගම පාර, ඉතාම වටිනවා. රජය ගත්තු ඉතාම ඥානාන්විත ක්‍රියාවක් හැටියට මම දකිනවා. නමුත් ඒ පාරටත් කිසිම ටෙන්ඩරයක් කැඳෙව්වෙ නැහැ. මෙන්න මේ වගේ අඩුපාඩුකම් තිබුනා ග්‍රාමීය අපට කෙලින්ම බලපාන දේවල්. මේවට නිලධාරීන් වගකියන්න ඕන. මේවා යම් ක්‍රමවේදයකට සකස් නොකිරීමේ ප්‍රතිඵල තමයි අපි අද අත්විදින්නේ. ඒ නිසා මම විශ්වාස කරනවා. අපි ඇනකොටා ගන්න අවශ්‍යතාවයක් නැහැ. මේ 27 දෙනා තමයි නාගොඩ ප්‍රාදේශීය සභාව තුළ දේශපාලන පොරපිටියෙ ක්‍රියා කරන්නේ. එනිසා සියලු දෙනාට මේ වෙලාවේ ආරාධනා කරනවා. මොන මතිමතාන්තර තිබුණත් ඉදිරියේ පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු මැතිවරණය ඉතා සාමකාමීව පවත්වන්නට කටයුතු කරමු. තමන් නියෝජනය කරන දේශපාලන පක්ෂය ජයග්‍රහණය කරවීමට කටයුතු කිරීමට අවශ්‍ය ශක්තිය ධෛර්ය ලැබේවායි ප්‍රාර්ථනා කරනවා. ඒ වගේම ඉදිරියේදී මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වයෙන් තුනෙන් දෙකක බලයක් සහිත රජයක් පිහිටුවනවා කියලා මතක් කරමින් මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

ගරු සභාපතිතුමනි, නියෝජ්‍ය සභාපතිතුමනි, සියලුම මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. මම හිතනවා සභාවට අයිති දේ මුලින්ම කතා කරනවා නම් හොඳයි කියලා. පසුගිය දවස්වල පුංචි ආරංචියක් ආවා. සභාවේ ටිපර් රථය බලපත්‍ර රහිතව පස් ප්‍රවාහනය කිරීමේදී අත්අඩංගුවට අරගෙන, සතියකට ආසන්න කාලයක් උඩුගම උසාවි භූමියේ තිබුණයි කියලා. ඒ නිසා අපි දැනගන්න කැමතියි. ඒ පස් ප්‍රවාහනය කළේ බලපත්‍ර රහිතව මේකට වගකිවයුත්තෙක් ඉන්නවා. වාහනයක් නිදහස් කිරීමේ දී පැහැදිලිවම ඒක නීත්‍යානුකූල විය යුතුයි. සමහර වෙලාවට සභාපතිතුමා මෙතන නොඉන්න පුළුවන්. අපේ වාහනයක් ලංකාවේ කොහේ හරි

ධාවනය කරනවා නම්, වාහන භාරව මෙතන නිලධාරියෙක් ඉන්නවනම්, අපේ වාහනය මේ අසවල් තැන යම් කටයුත්තක් සඳහා දීලා තියෙනවා කියලා ඔහු දැනුවත් වෙන්න ඕන. එතකොට පැහැදිලි තීන්දුවක් අපට එනවා. ඒ ටිපර් රථය එදා බලපත්‍ර රහිතව තහනම් පස් ප්‍රවාහනය සඳහා දීලා තියෙන්නේ කියලා. මේක අනුන්ගේ ගෙපලක් කපලා, පස් ඉවත් කරන්න ගිහිල්ලා, ඒ පස් පොල භූමියට දාලා,. මේ වංචනික ක්‍රියාවට සමාව ලබා ගැනීම සඳහා මම දකින විදිහට මේක නීත්‍යානුකූලභාවයක් තිබුනනම්, පොලිසියෙන් ආපු වෙලාවෙ, මෙන්න බලපත්‍රය කියලා ඉදිරිපත් කලානම්, ඔවුන් ආපසු යනවා. බලපත්‍රය නැති නිසා අත්අඩංගුවට අරගෙන අධිකරණයට ඉදිරිපත් කරලා, මේ වෙනකොට මොන ක්‍රියාමාර්ගයක් අරගෙන ද කියලා අපි දන්නේ නැහැ. නමුත් සභාපතිතුමාට මේ පිළිබඳව මේ විසි හත් දෙනා දැනුවත් කරන්න තිබුණා. නමුත් මේ 27 දෙනාම දැනගෙන නිශ්ශබ්දව හිටියා. මම කතා කරනකන් කවුරුත් කතා කලේ නැහැ. ඒ නිසා මේ සම්බන්ධව ඔබතුමාගේ පැහැදිලි කිරීමක් අවශ්‍යයි. ඒ වගේම, ලබන සභාවට මේ පිළිබඳ සවිස්තර වාර්තාවක් ඉදිරිපත්කළ යුතුයි. මම ඉතින් ඒ පිළිබඳ මීට වැඩිය කතා කරන්නේ නැහැ.

ඊළඟ කාරණය මේ දවස්වල බෝඩ් වගයක් ගහගෙන යනවා. මේක හරියට පහුගිය ආණ්ඩුව කාලේ කහ ඉරි සුදු කළා වගේ වැඩක්. පාරේ යන්න බැහැ. අට මාසයක් තිස්සේ අපි කතා කරනවා. අපේ ප්‍රදේශවල පාරේ කානු කෑල්ලක් තවම කැපුවෙ නැහැ. තමුන්නාන්සේලාගේ ෆයිල් පිරෙන්න යෝජනා තියෙනවා. ඒව කරන්න ඉස්සෙල්ලා, පාරෙ බෝඩ් ගහගෙන යනවා. හැබැයි ඒ පාරවල් වල යන්න බැහැ. තව එකක් මේකට සල්ලි වියදම් කරන්න ඕනේ නැහැ. මේ රටේ තියෙන යම් යම් සමාගම්වලින් මේවට අනුග්‍රහයක් ගන්න තිබුණා. මම යෝජනා කරනවා ඒ පාර හදලා බෝඩ් ගහන්න කියලා. මේ පාරේ යන්න බැරි නම් බෝඩ් එකෙන් වැඩක් නැහැ. ඒක නිසා මේ පිළිබඳ මීට වඩා සැලකිලිමත් වෙන්න. තමුන්නාන්සේලා මේ දේශපාලනය ගැන කතා කළා. මම කතාකරන්න යන්නෙ නැහැ. මේ ව්‍යවස්තාව ජේ. ආර්. ජයවර්ධන මහත්මයා හදනකොට ඇන්.ඇම්.පෙරේරා මහත්තයා ඇහුවා. හරි පුද්ගලයකුට අහුවුනොත් හොඳයි උන්මත්තකයකුට අහුවුනොත් මොකද කරන්නෙ කියලා. දෙයියන්ගෙ නාමෙට තමුන්නාන්සේලා, අපිත් දන්නෙ නැහැ. මේ රටේ මොකක්ද වෙන්නෙ කියලා. ජනාධිපතිවරු පස් දෙනෙක් පත්වුණා. අපි ගරු කරන්න ඕන. අඩු පාඩු තියෙන්න ඇති. හැබැයි ව්‍යවස්ථා විරෝධී වැඩක් කලේ නැහැ. මෙන්න මේ සැරේ ව්‍යවස්ථාවට ඇන් ඇම් පෙරේරා මහත්තයා කියපු දේ වෙලා තියෙනවා. දෙයියන්ගෙ පිහිටයි. අපි කවුරුත් පරිස්සං වෙලා ඉන්න ඕන. මෙතන තියෙන්නෙ පාට පක්ෂ භේදයක් නෙවෙයි. මොනව උනත් අධිකරණ තීන්දුවට අපි හිස නමන්න ඕන. සමහර විට තව ටිකකින් තීන්දුව දෙයි. ලක්රුවන් මන්ත්‍රීතුමා කිව්වා වගේ අපි ඇනකොටා ගන්න අවශ්‍ය නෑ. තමුන්නාන්සේලා අපි කවුරුත් ඒ පාහර දේශපාලනේ තුරන් කරන්න කටයුතු කරමු. මේ පාවාදීම් කාරයන්ට හෙට මැතිවරණයක් තිබ්බොත් තමුන්නාන්සේලා පාඩමක් උගන්වන්න. මේ දේශපාලනය මෙහෙන් තුරන් කරමු. කියන පණිවිඩේ මම දෙනවා. මම මීට වැඩිය කතා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. මම සභාපතිතුමාගෙන් බලාපොරොත්තු වෙනවා. අර පැහැදිලි කිරීම. නෙලී මන්ත්‍රීතුමිය කිව්වා වගේ අට මාසයයි. අපට මොකක්වත් ලැබුණේ නැහැ. අටයි හතරයි දොළහයි. අවුරුද්දකින් වත් අපට මොනවා හරි කරන්න. දැන් අයවැයෙන් අඩු ගානේ අපිට කියලා අත උත්සව ගන්නවත් පාරක් දෙකක් හදලා දෙන්න. තමුන්නාන්සේගේ මන්ත්‍රීවරුන්ට මොන ක්‍රමයකින් හරි කරනවා. අපි ඒකට විරුද්ධ නැහැ.

නමුත් අවුරුද්දක් යනකොට විපක්ෂ මන්ත්‍රීවරුන්ටත් වීථි ලාම්පුවක් හරි වැටෙන්න ඕන. හැබැයි තවම වෛද්‍ය නලාවවත් ගන්න බැරි වුණා. ඒ නිසා ඉදිරි සභාව වෙනකොට සියලු ජනතාවට ප්‍රයෝජනවත් වන වැඩපිළිවෙළක් සකස් කරන්න. මේ එන්නෙ තමුන්නාන්සේ ගේන පළමු අයවැය. මේ දක්වා අනුන්ගේ අයවැයක් ඇදගෙන යන්නේ. ඒ නිසා මේ අයවැය තුළ හොඳ දර්ශනයක්, නාගොඩ ප්‍රාදේශීය සභාව තුළ ,පාට පක්ෂ භේදයකින් තොරව හැමදෙනාටම යහපතක් වන ලෙස කටයුතු කරන ලෙස හා යහපත් සභාපතිවරයෙක් වෙන්න කියලා ප්‍රාර්ථනා කරමින් ඔබ සියලු දෙනාට සුභ දවසක් ප්‍රාර්ථනා කරමින් නිහඬ වෙනවා. ලේකම්තුමියගේ නැන්දම්මාගේ අභාවය පිළිබඳව අපේ බලවත් ශෝකය මේ අවස්ථාවේ පුද කර සිටිනවා.

**ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා**

ගරු සභාපතිතුමනි, බොහොම වෙලාවක් අගනා කතා රාශියක් කරපු වෙලාවක මමත් පොඩ්ඩක් කතා කරන්න ඕන. අපේ ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමා එතුමන්ලාගේ හිටපු නායකතුමාගේ සැමරුම් උත්සවයට යනවයි කිව්වා. අපි එතුමාට සුබ පතනවා. එතුමා නම් හොඳ මන්ත්‍රීතුමෙක්. පෙරටුගාමී කියලා තව පක්ෂයක් තියෙනවා. ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමා දන්නවා ඇති. ජනතා විමුක්ති පෙරමුණ දැන් ධනවාදී පක්ෂයක්. ගරු සභාපතිතුමනි, අපේ නෙළි මන්ත්‍රීතුමිය වීථි ලාම්පු ගැන කතා කළා. මමත් ඒ පිළිබඳව මතක් කරනවා. ඒ වගේම අර වෙද නලාව අරන් දෙන්න ඕන. ඒ ගැනත් මතක් කරනවා. ගරු මන්ත්‍රීතුමන්ලා කියපුවට කෙටියෙන් හෝ පිළිතුරක් දෙන එක යුතුකමක් කියලයි මම හිතන්නේ. එතුමන්ලා බලාපොරොත්තු නොවූ මොහොතක ව්‍යසනයක් සිදුවුණා. මේ ගැන, එතුමන්ලා ගැන අපිත් කනගාටුවෙනවා. එතුමන්ලට ගමට තියා එතුමන්ලාට වත් දෙයක් කරගන්න බැරි වුනා. අපේ හිතවත් මන්ත්‍රීවරුන්ට, අපි කරගත්තු දේවල්වත් ඔබතුමන්ලට කර ගන්නට බැරිවුණා. සොබාදහමත් තමුන්නාන්සේලාගේ ආණ්ඩුවට අකාරුණිකයි. දැන් මහින්ද මහත්තයා ආවා විතරයි වසන්තය උදා වුනා. වසන්ත මන්ත්‍රීතුමා කතා කළා මේ ආණ්ඩුව පත් කරපු හැටි බොහොම නීතිවිරෝධී කියලා. ජනාධිපතිතුමාට දොස් කිව්වා. ජනාධිපතිතුමා ගත්ත තීරණය නිවැරැදියි කියලා මම හිතනවා. මොකද මන්ත්‍රීවරුන් කෝටි 50ට 60ට විකිණෙන්න යනකොට පාර්ලිමේන්තුව මහා කලබගෑනියක් වෙලා, මන්ත්‍රීවරු මරා ගන්න යනකොට රටට නායකයෙක් හැටියට එතුමා ගන්න තියෙන වටිනා තීරණයක් ගත්තා. ඒ වගේම ඔබතුමාලා කතා කරනවා අගමැති තුමා පත් කරපු හැටි නීති විරෝධියි කියලා. මම හිතන්නේ හිටපු අගමැතිතුමා ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා එතුමා එක්ක යම් යම් මතභේද ඇති වෙනකොට ඔබතුමාලගේ නායකයෝ දෙදෙනෙකුට කතා කරලා තිබුණා. ඔබතුමාලා ඉහළින් වර්ණනා කරන නායකයන්ට අග්‍රාමාත්‍ය ධූරය ලබා දෙන්න ආරාධනා කරලා තිබුනා. ඒ වෙලාවේ එතුමන්ලා ගත්ත නම් එතුමා වටා ජනතාව එකතුවෙලා, අදටත් ඔබතුමන්ලගේ ආණ්ඩුවක් තියෙනවා. ඒ නිසා ඒ පිළිබඳවත් මතක් කරමින් ඔබතුමාලා හිතේ අමාරුවකින් ඉන්න මේ වෙලාවේ ඔබතුමාලා සියලුදෙනාටම අපි ජනවාරි පස් වෙනිදායින් පස්සෙ තුනෙන් දෙකක බලයක් සහිත නව රජයක් පත්කර ගනිමින්, ජනවාරි පහෙන් පස්සෙ සභාවට එන්නේ ආණ්ඩුවත් අරගෙන බවත් මතක් කරමින්, ඔබ සියලු දෙනාට සුබ අනාගතයක් පතමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තූතියි.

**ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා**

ගරු සභාපතිතුමනි, විපක්ෂනායකතුමනි, සියලු මන්ත්‍රීවරුනි, ලේකම්තුමියනි සියළු දෙනාගෙන් අවසරයි. මම කතා නොකරන්න හිටියේ. මගේ සහෝදර විජිත් සහබන්දු මන්ත්‍රීවරයා අපේ ගමේ අක්කර දහයක් තියෙනවයි කියලා කිව්වා. ඒකට උත්තර නුදුන්නොත් ඔබ ඇත්තටම පිළිගනීවි. එතුමා මෝඩ වුනාට ඔබතුමාලා මෝඩ නැති බව දන්නවා. දේශපාලන වශයෙන් කිසිම දෙයක් කරගෙන නැහැ. ගරු මන්ත්‍රීවරුනි, මෙතන බොහොම වැදගත් විදිහට කියන්නේ. නමුත් ඔබතුමාගේ අප්පොච්චි යූඇන්පී ආණ්ඩුවෙන් රජයේ ඉඩම් ගත්තා. ඒ වගේම ඔබතුමා මොනතරම් දේවල් ගත්තද කියලා සමෘද්ධි ලැයිස්තුව, සහනාධාර ලයිස්තුව බැලුවොත් පසුගිය අවුරුදු 20 පුරාවට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තමුන්නාන්සේගේ නම නොතිබුණොත් මම මේ මන්ත්‍රීකමෙන් අයින් වෙනවා. වගකීමෙන් කියන්නේ. ඔබතුමා මේ අභියෝග භාරගන්න. පසුගිය අවුරුදු 20 තුළ සහනාධාර ලයිස්තුවේ විල්බැරෝ එහෙම අරගෙන නැති වුනොත්, බලන්න. ඒ තරමට මෙතුමා දුප්පත් . ඒක නිසා මන්ත්‍රිතුමා අපට අපහාස කරන්න එපා. මතක තියා ගන්න. මෙතනින් අරගෙන එක ලයිට් එකක්වත් දාලා නැහැ. මේ සභා ලේකම්තුමියගෙන් අහන්න. බත් පැකට් එකක දෙයක් මෙතනින් අරගෙන නැහැ. ඒක මතක තියාගන්න මන්ත්‍රීතුමා. ඒ වගේ සක්කිලි වැඩ කරන මිනිහෙක් නෙවෙයි මේ නන්දන කියන්නෙ. අපි කරන දේවල් ඕන කෙනෙක් දන්නවා. අපිට මඩ ගහන්න එන්න එපා. ගරු සභාපතිතුමනි, මම කතා කරන්න නෙවෙයි හිටියේ . මේ කතාව නිසා තමයි මම නැගිට්ටේ. මහින්ද රාජපක්ෂ මැතිතුමා ගැන කතා කළා. එකට උත්තරයක් දෙන්න ඕන. ඒ වගේම ඔබතුමාලගේ ශ්‍රේෂ්ඨ නායකයෙක් කියලා, ඔබතුමාලගේ ආසනේට හුඟක් වැඩ කරයි කියන පියසේන ගමගේ මැතිතුමා ගෙන් ඇහුවා නම් දැන් කියාවි. ඒ වගේම තව ටික දවසකින් නිශාන්ත මුතුහෙට්ටිගම මැතිතුමාගෙන් ඇහුවත් කියාවි. එක නිසා අපි ඒ ගැන කතා කරන්නේ නැහැ. ඒ වගේම ලක්රුවන් මන්ත්‍රීතුමා කිව්වා කෘෂිකර්මයට උදව් කළේ නැහැ කියලා. අඩු පාඩු තියෙන්න ඇති. නමුත් ඔය මහින්ද රාජපක්ෂ මහත්මයා ඔබතුමාලගේ නායකතුමා තමයි. ජෝර්ජ් කොම්පැනිවලට අක්කර දහස් ගණනක් ලියලා දුන්නේ. ඒ වගේ හැම නායකයෙක් අතින්ම වැරදි වෙනවා. ඒ හැම නායකයෙකුටම වහල්ලු වෙන්නේ නැතුව, අපි රනිල් වික්‍රමසිංහ වැරදි නම් වැරදියි, මහින්ද රාජපක්ෂ වැරදි නම් වැරදියි. අපේ නායකයෝ වජිර අබේවර්ධන වැරදි නම් වැරදියි. දිස්ත්‍රික්කයේ වෙන දේශපාලනඥයෙක් වැරදි කරනවා නම් වැරදියි. වහල් දේශපාලනඥයෙක් වෙන්නේ නැතුව, තමන්ගේ මතය ප්‍රකාශ කරන්න. තමන්ගේ දේශපාලන වේදිකාවේ ගිහින් කියන්න යම් යම් දේවල් ඉතුරු වෙයි. නමුත් මෙතන කොන්ද ඇතිව තමන්ගේ මතය ප්‍රකාශ කරනවා වගේම මේ සභාවේ ගමේ වැරැද්ද කියන්න. පියල් මන්ත්‍රීතුමා, ගයාන් මන්ත්‍රිතුමා කියනවා. ඔබතුමා දන්නවා. අබේසුන්දර මහත්මයාගේ ගෙදර ගාව තවම වතුර බස්සන්න බැහැ. පළාත් සභාවේ බලය තියෙනවා. අවුරුදු විස්සක් තිහක්. දැන් ඔබතුමාලගේ පොහොට්ටුවේ උප සභාපති මේ ආසනය බලන්නෙ. පේන්නෙ නැද්ද මේ අය කරන්නෙ බොරුව. ගයාන් මන්ත්‍රීතුමාට, පියල් මන්ත්‍රිතුමාට පුලුවන්ද එතනින් යන්න. කට වහගෙන ඉන්නවා ඡන්ද පාඩු වෙයි කියලා. අපි බොරුවට ගොන්නු වගේ රණ්ඩු වෙනවා. මෙතන මේ ඔක්කොම කරන්නේ බොරු. ඒ හින්දා මේ මන්ත්‍රීවරුන්ට අපි වගකීමෙන් කියනවා. අපි හරි දේ කතා කරමු. වහල්ලු වෙන්න එපා. මේ දේශපාලනයට වහලු නොවී වැඩ කරන්න කියලා ඉල්ලමින්, ඔබ සැමට සුබ දවසක් ප්‍රාර්ථනා කරනවා.

**ගරු උප සභාපති එම්. කේ. ගාමිණී සුසන්ත මහතා**

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි, ගරු චන්ද්‍ර සහබන්දු මන්ත්‍රීතුමා ප්‍රකාශ කල පරිදි ලේකම්තුමියගේ නැන්දම්මාගේ අභාවය පිළිබඳව අපගේ බලවත් ශෝකය මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා. සභාවේ යෝජනාවක් වශයෙන් ඒකමතිකව සම්මත කරන්න.

ඒ වගේම අපේ ගයන්ති කුමාරි මන්ත්‍රීතුමියගේ බාප්පාගේ මළගම පිළිබඳව දැනගන්න ලැබුනත්, එයට සම්බන්ධ වෙන්න බැරි වුණා. ඒ පිළිබඳවත් ඔබතුමියගේ පවුලේ සියලු දෙනාටත් අපේ කණගාටුව, ශෝකය මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. ගරු සභාපතිතුමනි, අද අපේ ප්‍රාදේශීය සභාවේ, වෙනත් කරුණු යටතේ ගොඩක් කරුණු කාරණා විපර්යාස, ඒ වගේම විවිධ දේශපාලනික ක්‍රියාවලියන් පිළිබඳව නොයෙකුත් මත මේ සභාව හමුවේ තබන්න අද විශේෂයෙන්ම හේතු වෙනවා. දැනට අධිකරණයේ තිබෙන පාර්ලිමේන්තුව විසුරුවාලීම නීත්‍යානුකූලද, නැතිද යන්න පිළිබඳ තීන්දුව ප්‍රකාශයට පත් වුණා නම් අද මේ සභාවේ වැඩකටයුතු, හැසිරීම් රටාවන් හා ගරු මන්ත්‍රීතුමන්ලාගේ මන්ත්‍රීතුමියන්ලාගේ අදහස් ප්‍රකාශ කිරීම සියල්ල වෙනස් වෙන්න තිබුනා. මම හිතන්නේ තවත් පැය කීපයකින් තමයි ඒ තීන්දුව අපට ලබා දෙන්නේ. ඒ තීන්දුව ලැබුනත්, නොලැබුනත් විශේෂයෙන්ම ප්‍රාදේශීය සභාවේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙන් පොහොට්ටුවෙන් පත්වුණු ගරු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා විශේෂයෙන් මේ සභාවේ අපි බලාපොරොත්තු වෙනවා. මේ සභාවෙන් පසුව ඒ තීන්දුව මොන පැත්තට යොමු වුණත්, අපි බලාපොරොත්තු වුණා. හැකි ඉක්මනින් මැතිවරණයකට යන්න. පළාත් සභා වෙන්න පුළුවන්, පාර්ලිමේන්තු මැතිවරණය වෙන්න පුළුවන්, නැත්නම් ජනාධිපතිවරණය වෙන්න පුළුවන් අපිට අවශ්‍ය වෙලා තිබුණේ මැතිවරණයක්. අපි වසර තුනක කාලය තුල අපි මේ ජනතාවත් එක්ක මග බලාගෙන හිටියේ මැතිවරණයක් ඉල්ලා ගන්න. ප්‍රාදේශීය සභා මැතිවරණය බොහොම අමාරුවෙන්, පසුගිය රජයෙන් ලබා ගත්තා. ඒක ලේසි පහසු කාර්යයක් වුණේ නැහැ. මාස ගණන්, අවුරුදු ගණන් ඇදගෙන ගිහිල්ලා, ප්‍රාදේශීය සභා අකර්මණ්‍ය කරලා, මේ ප්‍රාදේශීය සභාව කොමසාරිස්තුමාගේ පාලනයට දීලා, ජනතාව නියෝජනය කරමින්, මේ ප්‍රාදේශීය සභාව හරහා යමක් කරන්න අපි සියලු දෙනාටම නොහැකියාව ලැබුණා. ප්‍රාදේශීය සභා මැතිවරණයෙන් විශිෂ්ට ජයග්‍රහණයක් ලබා ගත්ත ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ නැත්නම් පොහොට්ටුව පක්ෂය මේ මැතිවරණයේදී අපි විශේෂයෙන්ම බලාපොරොත්තු වෙනවා. නැවත වරක් සන්ධානගත වෙලා හරි නැවත වරක් ජනහිතකාමී යුගයක්, ජනහිතකාමී රටක් ගොඩනගන්න අපට ඉදිරියේදී හැකියාව ලැබෙයි කියලා. ඒ වගේම මම බලාපොරොත්තු වෙනවා අපේ ලක්රුවන් මන්ත්‍රීතුමා කරපු යෝජනාව, අපි කවුරුත් මේ ප්‍රාදේශීය සභා ඉවර වෙලා ගිහිල්ලා ඊළඟ මැතිවරණ වේදිකාවේදී කිසිම ගැටුමක් ඇති කර ගන්නේ නැතුව, සුහදත්වයෙන්, පක්ෂ පාට මොනවා තිබුණත් මැතිවරණය සඳහා හා දේශපාලන කටයුතු සඳහා ඒවා සීමා කරලා සුහදව මැතිවරණයක් ලබාදෙන්න කටයුතු කරන්න කියන යෝජනාව මම මේ අවස්ථාවේ ස්ථිර කරනවා. ඊළඟට මේ අවස්ථාවේ දී දීර්ඝ වශයෙන් යම් යම් කරුණු කාරණා කිහිපයක්ම මතු වුණා. අපේ ජනාධිපතිවරයා පිළිබඳව මම කියන්න කැමතියි. අපිට තාමත් එතුමා පිළිබඳව පැහැපත් සිතුවිල්ලක් ඇත්තටම එන්නේ නැහැ. අපි දන්නවා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ලේකම්වරයා වශයෙන් අපිව පාවා දීලා එදා එක්සත් ජාතික පක්ෂය ඇතුළු සන්ධානය සමග

එකතුවෙලා, ජනාධිපතිවරණයට ඉදිරිපත් වෙලා එතුමා ජයග්‍රහණය කළා. ජයග්‍රහණයත් සමග අපි එතුමා ජනාධිපතිවරයා වශයෙන් පිළි ගත්තා. ඒක අපි පිළිගන්න ඕන. අපි ඡන්දෙ කළාද, නොකළාද, මොන පක්ෂයද කියන ප්‍රශ්න නෙවෙයි. රටේ ජනාධිපතිවරයා, ජනාධිපති හැටියට අපි පිළිගන්න ඕන. ඒක අපි ඡන්දෙ දුන්න ද ,නැද්ද කියන එක ප්‍රශ්නයක් නෙවෙයි. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා රටේ ජනාධිපතිවරයා වශයෙන් අනිත් අය පිළිනොගත්තත්, පිළිගත්තත් අපි පිළිගන්නවා. එතුමා පහත් කොට සලකන්නේ නැහැ. එතුමා අද ගත්ත මේ ක්‍රියාමාර්ගය මම හිතන්නේ එක්සත් ජාතික පක්ෂයට, එතුමට සහයෝගය දැක්වූ අනෙක් පක්ෂවලට හොඳ ආදර්ශයක්. කවදාවත් ඒ වගේ නායකයෙක් බිහි කරන කොට මෙවැනි හවුල් සමාගම්වලින් ජනාධිපති හෝ වෙනත් අයෙක් වුවත් ඇති වෙන ප්‍රශ්න පිළිබඳ මම හිතන්නේ සියලු දෙනාට මෙය හොඳ අත්දැකීමක් වෙනවා. ඒ නිසා අපි මේ අවස්ථාවේ මතක් කර සිටිනවා. එක්සත් ජාතික පක්ෂය කියන්නේ හොඳ පක්ෂයක්. ප්‍රබල විශාල සාමාජික සංඛ්‍යාවක් ඉන්න පක්ෂයක්. තවදුරටත් ඔබතුමන්ලා නායකයින් බිහි කිරීමේදී, රටේ ජනාධිපතිවරයා, අගමැතිවරයා වෙනත් තනතුරකට බිහි කිරීමේදී එවැනි තීන්දු තීරණ ගන්නෙ නැතුව, පක්ෂයේ අනන්‍යතාව රැකගෙන කටයුතු කරන්න පුලුවන් පක්ෂයේ නායකයෙකුට අවස්ථාව ලබාදෙන්න කියලා ඔබතුමාට මේ අවස්ථාවේ මතක් කරනවා. මෙවැනි අවස්ථාවක් ලබා ගෙන අද රටේ නායකයා පත් කරල තිබුන නම් ඔබතුමාලට තවදුරටත් මේ රට කරගෙන යන්න ඉඩ ප්‍රස්තාව තිබුණ ද කියන එක මම මේ අවස්ථාවේ දී මතක් කර දෙන්න කැමතියි. අපි ඊළඟ මැතිවරණය පිළිබඳව කතාබහ කරද්දි , සහබන්දු මන්ත්‍රීතුමා කිව්වා වගේ ගමට ගියාම ඕක නෙවෙයි තියෙන ප්‍රශ්නේ, ගමේ මිනිස්සුන්ට, විශේෂයෙන්ම ගමේ මිනිස්සු බලාපොරොත්තු වෙන දේ රටේ නායකයන්ට දෙන්න බැරි වුණාම තමයි මෙවැනි ගැටලු ඇති වෙන්නේ. ගමට ගියහම බලාපොරොත්තුවෙනවා සමෘද්ධි කාඩ් එක හදාගන්න, රැකියාවක් ලබාගන්න, ගමේ සංවර්ධනය සඳහා යම් පාරක් කරයි කියලා, ජනතා නියෝජිතයන් වශයෙන් පාලක පක්ෂයෙන් බලාපොරොත්තු වෙනවා. නමුත් මේ සියල්ල ගම්වල අකර්මණ්‍ය වූ නිසා තමයි ඒ බලපෑම රටේ දේශපාලන නායකයන්ට උද්ගත වෙලා, මේ රට අර්බුදකාරී තත්ත්වයට පත්වෙලා තියෙන්නෙ. නමුත් දැන් ඒ අර්බුදකාරී තත්ත්වයෙන් මිදිලා නැවත වරක් යහපාලන ඒ වගේම ජනතා හිතවාදී පාලනයක් ඇතිකරන්න අපි සියලු දෙනාට අවස්ථාව ලැබිලා තියෙනවා. ඒ නිසා මේ ලබාදුන් අවස්ථාවෙන් උපරිම ප්‍රයෝජන අරගෙන අපි කවුරුත් වාද, භේද අමතක කරලා ඊළඟ මැතිවරණයට මුහුණ දීලා හොඳ ජනහිතකාමී යුගයක් ආරම්භ කරන්න කටයුතු කරනු ඇතැයි අපි බලාපොරොත්තු වෙනවා. ඒ නිසා අපි මේ අවස්ථාවේ මේ සභාවේ කතාබහ වෙච්ච කරුණු  පිළිබඳව එකින් එකට පිළිතුරු දෙන්න අවශ්‍ය නැහැ. ඒ අතරේ වැදගත් වූ කරුණු වගේම, වැදගත් නොවූ කරුණුත් තිබුණා. ඒ නිසා මේ අවස්ථාවේ තමුන්නාන්සේලාට ලක්රුවන් මන්ත්‍රීතුමා කිව්වා වගේ, අපි සියලු දෙනා මේ ප්‍රාදේශීය සභා භූමියෙන් නික්ම ගියාට පස්සේ මැතිවරණ කාලසීමාවේදී වෙනදා වගේ අපි හැම ප්‍රාදේශීය සභාවකම කතා කරල තියෙනවා. සුහදව, සහෝදරත්වයෙන් කටයුතු කරලා අපේ සුහදත්වය පලුදු නොවෙන්න දේශපාලන වේදිකාව ප්‍රයෝජනයට ගනී කියලා. එසේ බලාපොරොත්තු වෙමින් ඔබ සැමට සුබ අනාගතයක් ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා**

ගරු සභාපතිතුමා, නියෝජ්‍ය සභාපතිතුමා ඇතුළු සියලුම මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා ලේකම්තුමිය ඇතුළු සියලු දෙනාගෙන් අවසරයි. ඇත්තටම මම අද කතා නොකරනවයි කියලා හිතාගෙන හිටියේ. මේ සභාව ආරම්භයේ දී සිදුවුන සිදුවීමත් එක්කම වචනයක් ප්‍රකාශ කළ යුතුයි. මම කිව්වේ වෙරංග මන්ත්‍රීතුමාට පුද්ගලිකව අමනාපයක් ඇති කරගන්න කාරණයක් නෙවෙයි. මේ සභාවේ මන්ත්‍රීවරයෙක් විදියට මහජන මුදලින් යම් දෙයක් කරනවා නම් ඒක ඵලදායි අයුරින් කරනවද? නැද්ද? කියලා සොයාබැලීමේ අයිතියක් තියෙනවා. මන්ත්‍රීවරු විදියට, විශේෂයෙන් උඩුගම කොට්ඨාශය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් විදියට දුරකථන මගින් පැමිණිලි ආපු නිසා, ඒ සිද්ධිය පිළිබඳ අවධානය යොමු කළා. එහෙම නැතුව වෙරංග මන්ත්‍රීතුමා එක්ක පුද්ගලික තරහක් නිසාවත්, ඔබතුමා කරන දේ බලාගෙන ඉන්න බැරුවත් නොවෙයි. හිටපු සභාපති විලේගේ මහත්තයා උඩුගම ප්‍රදේශයට වැඩ කරනකොට අපි තමයි එතුමට පක්ෂ භේදයකින් තොරව සහයෝගය දැක්වූයේ. අපි කිහිපදෙනයි විශාල වශයෙන් සහයෝගයක් ලබා දුන්නේ. ඉතින් ඒ වගේ ගමට වැඩ කරනවා නම් අපි වැඩියෙන්ම කැමැතියි. පුද්ගලයා අදාළ වෙන්නේ නැහැ. පොළද, ශ්‍රවණාගාරයද, පෙර පාසල ද කියලා නැහැ මොනවාහරි වැඩක් කරනවා නම් අපි ගොඩක් කැමතියි. නමුත් ඒ සද්භාවයෙන් කරන වැඩේදි යම් හානියක් වෙනවනම්, මේ ප්‍රාදේශීය සභාවේ මහජන නියෝජිතයෝ කරනවනම්, ඒකෙ වෙන හානිය වැඩියි නම්, අපි ඒකට කතා නොකර ඉන්නව නම් වැරදියි. ගරු සභාපතිතුමනි, මම මීට කලින් සභාවෙදී කියපු එකක් මේක. මේ මුදල් ගෙවීම නිසා අද කියපු එකක් නෙවෙයි. ගිය සභාවාරයේ 33 පිටුව 34 පිටුව පොඩ්ඩක් බලන්න. පිටුවක් පිරෙන්න කතාකරලා තියෙනවා. ඒ සිදුවුනු තාක්ෂණික ගැටලු ගැන යම් සඳහනක් කළා. ඒ වගේ සදහනක් කරලා තියෙද්දි විශේෂයෙන් මේ සභාවේ නිලධාරී මණ්ඩලයට ඒකෙ දෝෂාරෝපණය කරනවා. ඒ වගේ, ඒකට අපි විරෝධතාවයක්, අදහසක් දක්වලා තියෙද්දි, ඒ වගේ දේවල් කරන්නේ ඇයි? මම සද්භාවයෙන් කිව්වේ. මේකට තව යම් කිසි මුදලක් යනවා නම්, මේ වැඩේ නිවැරදි කරලා ඒකත් මේ මුදලට එකතුකරලා ගෙවන්න. ඔබතුමාට මතක ඇති. ගිය සභාවේ දී මම කිව්වා අද කිව්වෙත් ඒකයි. නැතුව මේ යන රු.15000.00 නොවෙයි. මේකට රු. 25000.00 ක් ගියත් ඒක මිනිස්සුන්ට හානිදායක නොවෙන්න කරන්න ඕන. උඩුගම ක්‍රීඩාංගනයේ වූ ඒ සිදුවීමේදී විශාල වශයෙන් හානියක් සිදු වූ නිසා තමයි දුරකථන මාර්ගයෙන් සම්බන්ධ කරගන්න හැදුවේ. නැතුව මගේ පුද්ගලික අදහසක් නෙවෙයි. ඔබතුමා සභාපති හැටියට මට කිව්වා ඒක මෙතන කරන්න එපා කියලා. මේ සභාවේ මතභේදයක් ඇති කරගන්න මම කැමතිත් නැහැ. මම බොරුවක් කියනවා නෙවෙයි. මම එකයි සම්බන්ධ කළේ. ඔබතුමා එපා කිව්වා. එතනදි ඒක පිළිගත්තා වගේ වෙනවා. ඔබතුමාලා එන්න, ඕන නිලධාරියෙක් එවන්න. මම ඇවිල්ල ඒ තියෙන අඩුපාඩුව පෙන්නන්නම්. මොකද නැත්නම් මන්ත්‍රීතුමාලා හිතාවි මේවා දරා ගන්න බැරුව කරන දේවල් කියලා. උඩුගමට වැඩක් කරනවා නම් අපි තරම් වෙන කවුරුවත් සතුටුවෙන්නෙ නැහැ. ඇත්තටම මේ දේශපාලන පක්ෂයක් ඕන නැහැ. අපිත් කැමතියි. ගිය සතිය දක්වා ම අපේ පැහැදිලි රජයක් තිබුණා. ඒකෙන් හරි, මේ සභාවෙ සල්ලි වලින් හරි වැඩක් කරනවා නම්, අපි ඉතාමත් සතුටට පත් වෙනවා. ඒ වගේම සභාපතිතුමා, මම ඔබතුමාගෙන් අර කැබ් රථයේ බිල ගැන ඇහුවේ ඔබතුමා ගැන අහිතක්, ඔබතුමා වංචාවක් කරනවයි කියලා හිතල නෙවෙයි. ඒ ගැරේජ් එක වාහනවල ලයිට් හදන තැනක් නෙවෙයි. හෝල්ඩර් එකකට රුපියල්

හයදහස් ගණනක් ගෙවුවම මොකද, අපි වාහන පාවිච්චි කරන අය නිසා ඒ පිළිබඳ දැනුමක් තියෙනවා. මම බැලුවේ ඒකයි. ඔබතුමා කිව්වා ලබන වාරෙදි ඉදිරිපත් කරන්නම් කියලා. ඒක මට ඉදිරිපත් කලත්, නොකලත් ඒ ගැන සොයා බලන්න. මොකද මේ කැබ් රථයේ පිටුපස බ්‍රේක් ලයිට් එකක් හදන්න රුපියල් හයදහස් යනවා, එහෙමයි තියෙන්නේ. මම දන්නේ නැහැ කරපු වැඩේ මොකක්ද, කවුද කලේ කියලා. මෙහෙ තියෙනවා වගේ ඔය වගේ ඉලෙක්ට්‍රික් වැඩකරන ආයතන කිහිපයක්ම ඒ තැනක බිලක් වුනා නම් පිළිගන්න තිබුනා. මේ ස්ථානය ඉලෙක්ට්‍රික් වැඩ කරන තැනක් නෙවෙයි. ඒ වගේම දැන් ඔබතුමා ලබන වසරට මිල ගණන් කැඳවන්න, ආයතන ටිකක් ඉදිරිපත් කළා. මම කිව්වා ඒකෙ පිටපතක් අපටත් දෙන්න කියලා. විශේෂයෙන්ම වාහන වෙන්දේසි කරන්න රුපියල් අසූ අට දහස් ගානකුත්, වාහන රක්ෂණ වටිනාකමත් එදා ඉඳලා එහෙම කරගෙන යනවා. අපට පුළුවන් ඒ ආයතනවලින් මිලගනන් කැඳවන්න. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ වැඩ කරන නිසා දන්නවා වෙන ප්‍රාදේශීය සභා එහෙම කරනවා. ඒ වාහනවල ලයිස්තුවයි, වටිනාකමයි දාලා නිෂ්පාදිත වර්ෂය එක්ක අපට මෙන්න මේ වාහනයට ඔබතුමාලගේ ගණන කීයද කියලා මිලගණන් කැදවීමක් කරනවා. විශේෂයෙන්ම තවලම සභාව, යක්කලමුල්ල සභාවට උඩුගම අපේ ආයතනයෙනුත් ඒ මිල ගණන් දැනුම් දෙනවා. ඊට පස්සේ ඒ මිල ගණන් වලට තමයි ඒ අය ගන්නේ. විනිවිද භාවයක් ඇති ව ඒ කටයුත්ත කරනවා නම් හොඳයි. ඒ වගේම උඩුගම ශ්‍රවණාගාරයේ දිගින් දිගටම අඩුපාඩු පිළිබඳව මම කතා කළා. කතා කලාට අඩු පාඩු සකස් වෙලා නැහැ. උඩුගම ශ්‍රවණාගාරය තමයි ප්‍රාදේශීය සභාවේ ලොකුම සම්පත. එදා ඉඳලා කියනවා අඩු තරමින් බෝඩ් එකක්වත් ගහන්න කියලා. ගහපු බෝඩ් එකෙත් ශ්‍රවණාගාරය කියලා නැහැ. ඒක තමයි අපිට තියෙන වටිනාම සම්පත ඇයි එහෙම කරන්නේ. අපි කියන ඒවා වැදගත් නැද්ද කියලා හිතෙනවා. මොකද මම මේ සභාවේ පිටු පිරෙන්න කතාකරන ඒවා වාර්තා ගත වෙනවා නම් ඇයි ඒ පිළිබඳ සැලකිල්ලක් දක්වන්නෙ නැත්තෙ. ඊළඟට වත් වැරැද්ද නිලධාරී හරි මන්ත්‍රීවරු හරි කරනවනම්, අපි මේ කතා කරන ඒවායි තේරුමක් නැහැ. මම එදා ඉඳලම කිව්වා. අපි මේ පරිබාහිර ආයතනයක් ගැන කතා කරනවා නම්, ඒ කියන්නේ අපි මේ ප්‍රාදේශීය සභාවේ මෙන්න මේ වගේ කතා වුණා කියලා ඒ ආයතනයට ලිපියක් යවන්න. ඒ වගේම විලේගේ මන්ත්‍රීතුමා උදේ කතා කළා. වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට අදාල ආයතනයක් වන නාකියාදෙණිය වත්තේ රබර් කර්මාන්ත ශාලාව ගැන කතා කළා. මමත් කතා කළා. ඒ කතා කලාට ඒ කිසිම සදහනක් නැහැ. එතනින් එහාට වෙනදෙයක් දැනගන්නත් කැමතියි. සමහරවිට අපි කතා කරන්නේ අපේ අදහස් නෙවෙයි. වෙන කෙනෙක් දෙන තොරතුරක් අනුව තමයි අපි කතා කරන්නේ. මොකද අපට ඒ පුද්ගලයට කියන්න පුළුවන් අපි මෙන්න මේ සභාවේ කතා කලා. මෙන්න ඒ සඳහා ලිපියක් යැව්වා ඒ ලිපියේ පිටපතක් මටත් තියෙනවා කියලා. ඇත්තටම එහෙම කරන්න බැරිද සභාපතිතුමා. මොකද අපි කෘෂිකර්මය ගැන, පාරවල් ගැන සීයට අසූවක් කතා කරන්නේ පිට දේවල්. ප්‍රාදේශීය සභා ප්‍රශ්න නොවේ. මහජනතාව පීඩාවට පත් වෙන ප්‍රශ්.න ඒක නිසා ඒ අදාළ ආයතන දැනුවත් කරලා , අද කතා කරපුවයින් හරි පටන්ගෙන ප්‍රාදේශීය සභා තීරණ දැනුම්දීම කියලා අපි මෙන්න මේ සම්බන්ධව සභාවෙ කතා කළා කියලා , අදාල ආයතන වලට දැනුම්දීමක් කරලා, අදාල මන්ත්‍රීවරයාටත් පිටපතක් දෙන්න කියලා ඉල්ලනවා. එතකොට ඒ අදාළ ආයතනයෙන් ඒකට පිළිතුරක් හරි එවාවි.

ගරු සභාපතිතුමනි, මේ වාර්තාව දිහා බැලුවම නඩු වලට විවිධ නඩු අංක යටතේ කරපු වියදම් අපට පේනවා. මේ නඩු මොනවද කියලා ,මේ සභාවේ නවක මන්ත්‍රීවරුන්වත්, පරණ අයවත් දන්නෙ නැහැ. මේවා සභාපති තුමාගේ නිලධාරින්ගේ පෞද්ගලික නඩුද? වාහන නඩු ද? කියලා දන්නේ නැහැ. ඒක නිසා මේවට වියදම් කරනවා නම් ලබන සභා වාරෙට වත් මේ නඩු මොනවද කියලා වාර්තාවක් ඉදිරිපත් කරන්න කියලා ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ඒවගේම සභාවේ සේවකයන් ගැන ලක්රුවන් මන්ත්‍රීතුමා හොඳ අදහසක් දැක්වූවා. මටත් ඒ වගේ දැනුනා. හැමෝම නෙවෙයි. ඒ වගේ සමහර සේවකයෝ ඉන්නවා. සමහර වෙලාවට ඔබතුමාටත් control නැද්ද දන්නේ නැහැ. මේකේ ප්‍රධානියාගේ ඉඳලා පහලට, පහල ඉන්න සේවකයා ගරු කරන්න දැනගන්න ඕන මන්ත්‍රීවරුන්ට. ඒ වගේම ගෞරවයක් ලබා නොදෙනවා නම් ඒක ගැටළුවක්. අපි සභාවට එන දවසට මෙතන වතුර බෝතලේ තියලා, ඒ කරන එක නෙවෙයි වැඬේ. මේ කාල සීමාව තුල මොන පක්ෂයෙන් පත් වුවත්, ඒ මන්ත්‍රීවරයාට ඒ ගෞරවය හිමි වෙන්න ඕන. මම දන්නවා සමහර නිලධාරීන් ඉන්නවා. වැඩක් කියලා ඒක කරගන්න බැරි උනාම ෆෝන් එක ඕෆ් කර ගන්න අය ඉන්නවා. ඔබතුමාටත් එහෙමද දන්නෙ නැහැ. මට විතරක් ද දන්නෙත් නැහැ. අඩුගානේ මේ මන්ත්‍රීවරුන්ට ගරු කන්නේ කොහොමද කියලා සේවක රැස්වීම්වලදී පැහැදිලි කරලා දෙන්න. එහෙම නැත්නම් මේ සේවක රැස්වීම් වලට මේ මන්ත්‍රීවරුන්ට ආරාධනා කරන්න. එතකොට අපට පුළුවන් සේවකයෝ ඉස්සරහ පැහැදිලි කරන්න. සේවකයන්ට වඩා මන්ත්‍රීවරුන්ට නියෝජනයක් දෙන්න ඕන. මම මේ යම් අත්දැකීමක් එක්ක කතා කරන්නේ. ඒ වගේම තමයි සේවකයන් ප්‍රාදේශීය සභාවට උදේට ආවට පස්සේ ඇඟිලි සළකුණ තියලා හවසට කීයටද යන්නේ කියලා මට ලේකම්තුමියගෙනුත් අහන්න සිදු වුනා. අපි දකිනවා මේ සේවකයෝ එක එක වෙලාවට යනවා. ක්ෂේත්‍රයේ යන අයට වෙලාවක් නැහැ කියලා තමයි දැනගන්න තියෙන්නේ. නමුත් ඒ සේවය හරියට සිදු වෙනවාද කියලා බලන්න ඕන. අතිකාල දීමනා ගෙවන්න ඕන කියලා කිව්වා. එහෙම ගෙවන්න ඕන කෙනෙක් ඉන්නවනම් ඒ කටයුතු හරියාකාරව ඉටු වෙනවාද කියලා බලලා එම දීමනා ගෙවන්න ඕන.

අවසාන වශයෙන් පසුගිය දවසක අපේ නිවසට පුද්ගලික දුරකථන සමාගමකින් ආවා. මේක මගේ අදහසක්. ඔවුන් කිව්වා මන්ත්‍රීවරු අතරේ කතා කරන්න පුළුවන් සිම් එකක් නොමිලේ දෙන්න පුළුවන් කියලා. ඒක නිසා මේ ගැන සොයා බලා ඒක ගන්න පුලුවන්නම් ලබාගැනීමට කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිමින්, හිටපු සභාපති තුමා සහබන්දු මහත්මයා කතා කළා. උඩුගම පස් සිද්ධිය පිළිබඳව, එතුමා සද්භාවයෙන් වැඬේ කලාට අවසානයේ සිදුවුණේ ප්‍රාදේශීය සභාව නඩුවක් දාගත්ත එක විතරයි. අපි මන්ත්‍රීවරු හැටියට අපට අදාල දේ විතරක් කරනවනම්, මෙහෙම දේවල් වෙන්නෙ නැහැ. මේ සභාවට මීට පෙර සිදුනොවුන සිදුවීමක් වුණේ. ඒක සභාවට අගෞරවයක්. ඉදිරියට මේ වගේ දේවල් සිදු නොවෙන්න සභාපතිතුමා ඇතුළු ඒ ගැන යොදවා සිටින අය ඒ ගැන අධීක්ෂණය කරන්න කියලා ඉල්ලා සිටිනවා. මොකද මෙතන ඉන්නේ විවිධ උගත් මට්ටම් වල, විවිධාකාර අදහස් තියෙන මන්ත්‍රීවරුන්. ඒක නිසා මේ වාහනේ ගෙනිච්චම තමන්ට ඕන දෙයක් කරන්න පුළුවන්. ඒක හරියාකාරව යොදවන්න ඕන. මොකද ඉතිහාසයේ ප්‍රාදේශීය සභාවට එහෙම නඩු වැටිලා නැහැ. නමුත් මේකෙ යම් යම් වැරදි වැඩ කරලා ඇති. නමුත් ඒව පාලනය කරගත්තා. උඩුගමට එස්ටීඑෆ් එකෙන් ඇවිල්ලා, නාගොඩ ප්‍රාදේශීය සභාවේ වාහන

ඇල්ලුවයි කිව්වහම අපටත් හොඳ නැහැ. ඒක නිසා ඒ සියලු ආකාරයේ වැරදි අදින් පස්සෙ වත් නවතින්න වැඩපිළිවෙළක් අධීක්ෂණයක් කරන්න කියලා ඉල්ලා සිටිමින්, ඔබ සියලු දෙනාට සුභ දවසක් ප්‍රාර්ථනා කරමින් , මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා**

මූලාසනාරූඪ ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. මම මුලින්ම ලේකම්තුමියගේ නැන්දණියගේ මළගම වෙනුවෙන් සහභාගී වීමට නොහැකි වීම පිළිබඳව ශෝකය ප්‍රකාශ කරනවා. ඒ වගේම මම දෙවනුව සඳහන් කරනවා. මේ සභාව වාර හතක් තියලා වාර අටක් තියලා, යම්කිසි මෙහෙවරක් කළා නම්, අපට ප්‍රාදේශීය මට්ටමින් දකින්න ලැබුණේ බොහොම සීමිත වැඩ කොටසක් අතරින් සුවිශේෂී වූ වැඩක්. ඒක තමයි බෝදරගම මන්ත්‍රීතුමිය, ඔබතුමියගේ මැදිහත්වීම මත අසරණ පවුලකට ගෙයක් හදලා පදිංචි කළා. අපි මේ ගරු සභාවෙ අවංකවම එතුමියට ස්තුතිය ප්‍රණාමය ගෞරවය පුද කරන්න අවස්ථාවක් කර ගන්නවා. ඔබතුමියගේ සත්කාරයෙන් කරපු ඒ වැඩේ, ගොඩක් අසරණ මිනිස්සුන්ට උපකාර කරලා, හිසට සෙවනක් දෙන්න ඔබතුමිය දැක්වූ වෑයම වෙනුවෙන් ඔබට මම මේ අවස්ථාවේ මගේ සුභාශිංශන හා ස්තුතිය ප්‍රකාශ කරන්න කැමතියි.

ඒ වගේම තමයි ඊළඟට අපි තරංග මන්ත්‍රීතුමා ගිය සභාවෙත් උඩුගම මහජන ක්‍රීඩාංගණය ගැන සඳහන් කළා. මෙතනදී මතක් කළේ තරංග මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ කාරණය සත්‍යයක්. මම එදත් පිළිගත්තා. එතන කාණුවක් කපන්න ඕන කියන එක පිළිගත්තා. නමුත් ඒක අවුරුදු පහළොවක්, විස්සක් ඉඳලම දැන් අවුරුදු 15කින් තමයි ඩෝසරයක් දාලා උඩුගම මහජන ක්‍රීඩාංගණය සුද්ද කලේ. ඉතින් එතනදී මට ලැබුණේ පැය හයයි. නමුත් මම පැය 9 1/2 වැඩ කළා. ගරු සභාපතිතුමනි, ඉතුරු පැය 3 1/2 සල්ලි මගේ අතින් දුන්නේ. ඒ වගේ සද්භාවයෙන් මම වැඩ කරන්නේ. මේ නිසා එතන අනතුර මම දැක්කා. මම බැලුවා. ගිහින් ඒක එදා ඉඳලා තිබුණු එකක්. අපි පිට්ටනිය අඟලක්වත් කැපුවෙ නැහැ. තිබුන විදිය ඔබතුමා දැක්කා. අපි සුද්ද කලා විතරයි. කැලේ ගස් කපලා ඩෝසරයෙන් ඉවත් කළා විතරයි. පිට්ටනිය අලුතින් කැපුවෙ නැහැ. ඉතිං ඒක නිසා ඉදිරියේදී තාක්ෂණ නිලධාරීන් යොදවලා, එම ස්ථානය ස්ථානීය පරීක්ෂාවට ලක්කරගෙන, ඒ අවදානම ඉවත් කරන්න අපි කටයුතු කරමු. ඒ වගේම තමයි පස් ගැටළුව පිළිබඳව, හිටපු සභාපති සහබන්දු මැතිතුමා, තරංග මන්ත්‍රීතුමා සඳහන් කළා. මොකද උඩුගම පොල සම්බන්ධව ගත්තට පස්සේ මා මෙතනට පත්වූ දා සිටම මගේ අදහසක් සහ මගේ උත්සාහයක් තිබුණා. උඩුගම පොළ සංවර්ධනය කරලා, මිනිස්සුන්ට මඩ වගුරුවල ලගින්නේ නැතුව පිරිසුදු පොළ දිනයක් වෙනුවෙන්, මේ උඩුගම ප්‍රදේශයේ සියලු මන්ත්‍රීවරු කතා කළා. ඒ අතරේ ඔබතුමා දන්නවා. මම උඩුගම පොළ වෙනුවෙන් මොන තරම් මහන්සියක් ගන්නවා ද කියලා. ලී ටික මම මගේ ලොරියෙන් අරන් එනවා. කළු තෙල් ටික ගෙනත් දෙනවා. පෙට්‍රල් ටික දෙනවා. උන ගස් ටික අරගෙන එනවා. ඉතින් ඔහොම ඉන්න අතරේ තමයි මෙසේ සිදු වුනේ. සභාව දැනගන්න ඕන මේක සද්භාවයෙන් කරපු වැඩක්. නමුත් අවාසනාවකට ඒ වගේ සිද්ධියකට මුහුණ දෙන්න වුන හේතුව මම මුල ඉඳලා පැහැදිලි කරන්නම්. එහෙම යනකොට, මේ කාලය තුළ අපට පොළ වෙනුවෙන් පස් ලබාගැනීමේ අවශ්‍යතාවක් තිබුණා. ඒ පිළිබඳ මම ගරු සභාපතිතුමා දැනුවත් කළා. සභාපතිතුමා කිව්වා කොහොමහරි මේ පස් ටික ගෙනිහින් දාන්න ඕන කියලා. ඒ යන අතරේ පස් කඳු කඩාවැටීම් තිබුණා. ඒවා ඉවත් කිරීමේ බලයත් ලැබිල තිබුනා. ඒ අතරේ අපට

නිකන් J.C.B යන්ත්‍රයක් වත් නොදා කපලා නිකම් පස් දෙන කෙනෙක් ඉදිරිපත් වුණා. ඒ අතරෙදි මම සභාපතිතුමාට කිව්වා. සභාපතිතුමා හොඳයි කිව්වා. අපට සල්ලි නැති එකේ නිකන් හරි මේක ලැබෙන එකේ, අපි මේක කරමුයි කිව්වා. ඊලගට මමයි සභාපතිතුමායි උඩුගම පොලිස් ස්ථානාධිපතිතුමා හමුවෙන්න ගියා. එතුමා හමුවෙලා සාකච්ඡා කලාට පස්සේ එතුමා දැනුවත් කළා. මේක මහජන සුබසිද්ධිය සඳහා වූ දෙයක්. ඒ නිසා මේ වැඩේ කරගන්න අපට අවස්ථාව ලබල දෙන්න කියලා. ඉතින් අපි උදේ අටේ සිට උඩුගම පොළට පස් ප්‍රවාහනය කරන්න සභාපතිතුමා ලොරිය එවලා තිබුණා. මා ඒ සම්බන්ධව වගකීමෙන් කටයුතු කළ මන්ත්‍රීවරයෙක්. මොකද මම නිරන්තරයෙන් උඩුගම පොලේ සංවර්ධන කටයුතු නිතරම අධීක්ෂණය කරන මන්ත්‍රීවරයෙක්. ඒක කම්කරුවො ටික දන්න ප්‍රශ්නයක්. ඉතින් ඒක නිසා සවස 2.30 වෙනකම් අපි මේ වෙන කොහේටවත් නොවෙයි පස් ඇද්දේ උඩුගම පොළට.  කවුරුහරි ,දරාගෙන ඉන්න බැරි කවුරුහරි පිරිසක් එස්ටීඑෆ් එකට ආරංචිය දුන්නා. අපට දැන් ආරංචි හැටියට OIC මහත්තයත් එක්ක ඇතිවූ ගැටුම්කාරී තත්වයක් උඩ මේ දේ සිදු වුණාය කියන සැකය තියෙනවා. ඒ නිසා විශේෂ කාර්ය බලකායට දුරකථන ඇමතුමක් දීලා අපිව අත්අඩංගුවට ගත්තා. මම මේ නඩුව තුළ මම පැහැදිලිවම මුල ඉඳලම මම සභාපතිවරයාටත් වඩා ඒ නඩුවේදී සහ ඒ වගකීමෙන් ඒ සම්බන්ධව මම වැඩ කරනවා. ඉතින් එදත් අපට තියෙන නීතිමය රාමුව තුළ නීත්‍යානුකූලව පස් ප්‍රවාහනය පිළිබඳ සභාපති වරයාගේ බලතල  අනුව මහජන පීඩාව ඉවත් කිරීමේ බලතල යටතේ අපි නිවැරදිකාරයා වෙනවා කියලා අපි නඩු කියනවා. නඩුවේදී මම වගකීමෙන් කියනවා ජයග්‍රහනය කරත්, නොකලත් ඒ සියලු මුදල් ප්‍රාදේශීය සභාවෙන් ලබාගන්නේ නැහැ. මම ඒ සියලූ වගකීම් භාරගන්නා බව මේ අවස්ථාවේදී මම ප්‍රකාශ කරනවා. ඒක නිසා කවුරුත් කලබල වෙන්න ඕන නැහැ. ඒක නිසා මම වගකීමෙන් කියනවා මොන බාධක ආවත්, උඩුගම පොළ සංවර්ධනය කරන එක කරනවා. ඒ වගේම තමයි වගකීමෙන් කොට්ඨාසයට වගකියන මන්ත්‍රීවරයෙක් හැටියට සෑම දෙයක්ම සොයා බලාගෙන වැඩ කරනවා. ඒ වගේම තමයි ගරු හිටපු සභාපතිතුමනි, ඔබතුමා මේක මතක් කරලා දුන්නා. ඉතින් මේක ලොකු ගැටලුවක් තමයි. නමුත් සභාපතිතුමනි, මේක මුදල් ගනුදෙනුවකටවත් නොවෙයි සද්භාවයෙන් සිදු කලා කියලා මම කියනවා. මේ පිළිබඳව හිනිදුම ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිතුමා විශේෂ පරීක්ෂණයක් කළා. එකේදි තීන්දු උනේ මේක සද්භාවයෙන් කරපු වැඩක්, කිසිම ආකාරයකින් මුදල් ගනුදෙනුවක් මත සිදු වෙච්ච දෙයක් නොවෙයි කියලා ජේෂ්ඨ පොලිස් අධිකාරීතුමාගේ නිර්දේශය ඉදිරිපත් වුණා. ඒ නිසා අපි සතුටු වෙනවා. අපි මුදලක් බලාගෙන නොවෙයි අපි වාසි බලාගෙන නොවෙයි අපි සද්භාවයෙන් යුතුව උඩුගම පොළ දියුණු කිරීම සහ මිනිසුන්ගේ අවශ්‍යතාවය වෙනුවෙන් ඒ අවශ්‍ය පෙළගැස්ම අපි සිදු කළේ. මට ඉදිරියේදී ලක්ෂ එකහමාරක දඩයක් ගැහුවත් ඒ දඩය ගෙවන්න වුණත් මම ලෑස්තියි. මං ඒ මුදල තියා ඒ නඩුවට යන කිසිම මුදලක් මේ ප්‍රාදේශීය සභාවෙනලබා ගන්නෙ නැහැ. නඩු ගාස්තුවත් මම ඉදිරියට ප්‍රාදේශීය සභාවට දරන්න ඉඩ තියන්නේ නැතෙයි කියලා වගකීමෙන් මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා. මොකද සභාපතිතුමා ඔබතුමා මට බාර දුන්නේ වගකීමක් ඇතුව. මම ඒ වගකීම භාර ගන්නවා. ඒක නිසා ඒ ගැන මතක් කරමින්, මහ බැංකුව කොල්ල කෑවේ නැහැ. ඉතින් ඒ වගේ සිදුවීමක් නෙවෙයි මේක. පොඩි වැරදීමක් තියෙනවා. නැත්තෙ නැහැ. ඒක පිලිගන්නවා. නමුත් ඔබ තුමාල පිළිගන්න ඒක සද්භාවයෙන් කරපු වැඩක් කියලා තේරුම් ගන්න.

ගරු සභාපතිතුමනි මම මේ අවස්ථාවේදී කියනවා. අපේ පහුගිය දවස්වල ක්‍රීඩා උත්සවයක් තිබුණා. ඒකට අපි ඔක්කොම සම්බන්ධ වුනා. ඉතින් මේකට ලක්ෂ දෙකයි ගාණක් වෙන් කරලා තිබුනා. ටීෂර්ට් වලට 60000.00 ක් දාලා තිබුනා. ඒකේ ඇත්තටම අර්ථය වුනේ මේ හැමෝගෙම ප්‍රාදේශීය සභාවල සුහදත්වය තහවරු කිරීම සඳහා තමයි මේ ක්‍රීඩා උත්සවය කෙරෙන්නේ කියලා. මම දන්නේ නැහැ. මට නම් එහෙම දෙයක් එතන හැඟුණේ නැහැ. හදිස්සියෙවත් අසනීප වීමක් සිදුවුනොත්, අඩුගානේ බෙහෙත් ඩිංගක් දාන්න ප්‍රථමාධාර පෙට්ටියක් වත් නැහැ. ඒක නිසා මම හිතනවා ඉතා අසාර්ථක ව්‍යාපෘතියක්. එකෙන් සුහදතාවය ගොඩනැගෙන්නෙ නැහැ. අපි කවුරුත් වෙන සභා සමඟ සම්බන්ධ වුණේ නැහැ. අපට අඩු ගානේ වොලි බෝලයක් වත්, ටෙනිස් බෝලයක් වත් ක්‍රීඩා අමාත්‍යාංශයෙන් දුන්නේ නැහැ. ඒක නිසා ගරු සභාපතිතුමනි, මම හිතනවා, මම යෝජනා කරනවා. සමස්ත මන්ත්‍රී මණ්ඩලයේ ම අවධානය යොමු වෙලා ලබන අවුරුද්දේ කම්කරුවාගේ සිට ලේකම්තුමිය දක්වා, මන්ත්‍රීවරුන්ගේ සිට සභාපතිතුමා දක්වා සියලු දෙනා සම්බන්ධ වෙලා දින දෙකක අපට පුළුවන් නේ ඔය ක්‍රීඩා උත්සවය කරන්න. අපේ කම්කරුවාගේ සිට නිලධාරියා දක්වා සුහදතාවය වර්ධනය වෙනවා. අපි අතර තියෙන දුරස් භාවය ඉවත්වෙනවා. ඉතින් එතනදි අපේ මේ තියෙන සුහදතාවය වර්ධනය කිරීමට මම යෝජනා කරනවා. එන ක්‍රීඩා උත්සවය ප්‍රාදේශීය සභාව තුළ පමණක් සියළු දෙනාගේ එකතුව තුලින් ක්‍රීඩා උළෙලක් සංවිධානය කරන්න යෝජනාව ස්ථිර කරයි කියලා මම ඔබතුමාගෙන් බලාපොරොත්තු වෙනවා. ඉතින් මම කියන්නේ ඒ ක්‍රීඩාවන්ට සම්බන්ධ වුණ නිසා. ඊළඟට අපේ මුදල් සහ කාලය එතනට යනකොට අපේ රියැදුරු මහත්තුරු යනවා. මෙහෙ සභාවේ දවසක් අකර්මන්‍යයි. නිලධාරීන් යනවා. නිලධාරීන් ගියාම ඒ අයට බත් පැකට් එක, කිරි පැකට් එක ඒව දෙන්න ඕන. මේ ප්‍රාදේශීය සභාවට මේකෙන් පාඩුවක් සිද්ධ වෙන.වා ඉතින් මම හිතනවා දිනයක් වෙන්කරගෙන ක්‍රීඩා උත්සවයක් තියලා සියලු දෙනා එකතු වෙලා, සතුටු වෙලා ගෙට් ටුගෙදර් පාර්ටි එකක් හරි අපි ඔක්කොම එකතු වෙලා සුහදතාවය බෙදා හදාගන්න අපට රාත්‍රී කාලයේදී හරි අපේ සුහදතාවය වර්ධනය කරගන්න ක්‍රමයක් සකස් කරන්න. අපේ මහ ඇමැතිතුමා දුන්නේ ආතති කළමනාකරණය. ඒ වගේ ආතති කළමනාකරණය මගින් අන්තිම දිනයේ සුහදත්වය වඩ වඩාත් වර්ධනය කරගන්න පුලුවන්. ඒ වගේම තමයි සභාපතිතුමනි අද මේ රටට වෙලා තියෙන දේශපාලන අස්ථාවරභාවය පිළිබඳව, මේ සියලු දෙනාම අදහස් දැක්වූවා. අපේ අදහසක් අපි ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ වශයෙන් මේ රටේ දුක්විඳින රට අස්ථාවර වෙච්ච යුගයෙන් නැවත මහින්ද රාජපක්ෂ යුගය නියත වශයෙන්ම තීන්දු වෙනවයි කියලා ප්‍රකාශ කරමින්, සියලු දෙනාට ස්තූති කරමින් මා නිහඬ වෙනවා.

**ගරු සභාපති තුමාගේ මූලාසන කතාව**

නියෝජ්‍ය සභාපතිතුමා, සියලුම මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා, ලේකම්තුමිය ඇතුළු සියලු දෙනාගෙන් අවසරයි. ඒ වගේම මම පළමුවෙන්ම කියන්න ඕන. අපේ හිටපු සභාපතිතුමා, සහබන්දු මහත්තයා අපේ සභාවේ වාහනේ පිළිබඳව කතා කළා. වාහනේට පස් අදින්න වාහන බලපත්‍ර දීල තියෙන්නෙ ගාල්ල මහ දිසාපතිතුමා. පසුගියදා ඇතිවූ ගංවතුර හානි වලට පස් ප්‍රවාහනය කරන්න ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට ලිඛිතව දැනුම් දීලා තිබුණා. පස් කියුබ් 35ට සීමා නොකර ඕන තරම් ප්‍රමාණයක් අදින්න මේ මාසේ තුන්වෙනිදා වෙනකන් ඉඩ ප්‍රස්ථාව ලබා දී තිබුණා. මොකද කඳු නාය ගිහිල්ලා, පස් කඳු කඩා වැටිලා, ඒවා අදින්න ඒ තුළ කිසිම කෙනෙකුට බලපත්‍රයක අවශ්‍යතාවයක් තිබුණෙ නැහැ. ඕනම කෙනෙකුට අදින්න පුළුවන්. හැබැයි එකක් තියෙනවා. නාය ගියපු ස්ථානවලින් තමයි පස් අදින්න පුලුවන්. පෞද්ගලික ස්ථානවලින් පස් අදින්න බැහැ. ඒක කොන්දේසියක්. ඒ අනුව තමයි වෙරංග මන්ත්‍රීතුමාත්, අපිත් පොළ සංවර්ධන කටයුත්තේදී, පස් අවශ්‍යතාවයට පිට්ටනිය සංවර්ධනය කරපු තැනිත් පස් ගෙනිහින් දාන්න සාකච්ඡා කළේ. මේ පස් ප්‍රවාහනයට බලපත්‍ර ගන්න ඕන. නැත්නම් ඒ ආයතන සමග කතා කරලා ඒ අවශ්‍ය කටයුතු කරන්න ඕන. ඒ අනුව තමයි වෙරංග මන්ත්‍රීතුමාත්, මමත් උඩුගම පොලිසියට ගිහිල්ලා ස්ථානාධිපතිතුමා හමුවෙලා කතා කලා. එතුමා අපේ පොළට නිසා වාචික අවසරයක් දීලා කරගන්න කිව්වා. ඔය අතරේ තමයි ගංවතුර ආවේ. ඒක නිසා අපට අපේ කටයුත්ත කරගන්න බැරිවුනා. ගංවතුර නිසා බල ප්‍රදේශයේ නොයෙක් ස්ථාන නාය ගියා. පස් කඳු කඩා වැටුණා. ඒ නිසා අපට වෙනත් කටයුතු කරන්න සිදුවුනා. ඔය අතරෙ තමයි අක්මීමන ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා ඇතුළු නිලධාරීන් ඇවිල්ලා අපේ බල ප්‍රදේශයේ බොහෝමයක් ළිං ඉහළ දීලා, අපට ආධාර උපකාර කළා. මේ අවස්ථාවේ ඒ අයට අපි ස්තුති කරන්න ඕන. ඒ වගේම ස්තුති කරලා ලිපියක් යවන්න ඕන. බද්දෙගම ප්‍රාදේශීය සභාවෙනුත් අපට උදව් කළා. j.c.b. යන්ත්‍රයක අවශ්‍යතාවය තියෙන නිසා j.c.b. යන්ත්‍රය රත්ගම ප්‍රාදේශීය සභාවෙන් දෙන්නම් කිව්වා. මේ අතරතුර ප්‍රාදේශීය ලේකම් විසින් ස්ථාන කිහිපයක් නම් කර එම ස්ථානවල නායයාම් හේතුවෙන් කඩා වැටුන පස් ඉවත් කරලා දෙන ලෙස ඉල්ලා ලිපියක් එවා තිබුණා. අපි j.c.b. යන්ත්‍රය එනකම් බලාගෙන හිටියා. ඒක ආවෙ නැහැ. ඔය අතරේ තමයි අපට ආරංචි වුණේ යම් පෞද්ගලික ස්ථානයක පස් කපලා දෙනවා. අපට තියෙන්නේ ප්‍රවාහනය කර ගන්න විතරයි කියලා. මම හිතන්නේ පස් කියුබ් එකක් අපි සල්ලි වලට ගන්න ගියා නම් රුපියල් 1500ක් 2000 ක් විතර වෙනවා. ඉතින් අපට වාහනය තියෙන නිසා නැවත වරක් උඩුගම පොලීසියේ ස්ථානාධිපතිතුමා දැනුවත් කරලා, අදාල පස් කපන තැන අයිතිකරුවන් පොලිසියට කැඳවලා, වෙනත් වාහන වලට දෙන්න එපා මේ වාහනයට විතරක් දෙන්න කියලා එම පස් කපන ස්ථානයේ අයිතිකරු දැනුවත් කලේ පොලීසිය ඉස්සරහා. අපි හොරකම් කරන්න යන්නේ නැහැ. කොහොම නමුත් මේ අපේම මිනිස්සු ,පෞද්ගලිකව අපිත් එක්ක තියෙන අමනාපයට නොවෙයි. OIC මහත්තයා එක්ක තියෙන අමනාපය නිසා වෙන්න පුළුවන්. මොකද OIC මහත්මයා හැම පස් ලොරියක්ම, වැලි ලොරියක්ම අල්ලනවා. එයත් එක්ක ව්‍යාපාරික පිරිසක් තරහයි. ඔවුන් තමයි මේ පිටුපස ඉන්නේ කියලා ආරංචියි. මම උදේ සභාවෙ ඉන්නකොට ප්‍රාදේශීය ලේකම්තුමිය කතා කරලා සභාපතිතුමා උඩුගම පස් අදිනවද කියලා ඇහුවා. මම ඔව් කියලා, එතුමියට පොඩ්ඩක් ඉන්න කියලා, මම වෙරංග මන්ත්‍රීතුමාට කතා කළා. ඔහු කිව්වා උදේ ලොරිය ආවා. පස් කපන්නේ අසවල් තැන. මම එතන ඉන්නවා.

මම ඒකෙ වගකීම බාරගන්නවා. පොඩ්ඩක්වත් පිටට දෙන්නේ නැහැ කියලා කිව්වා. එතුමා ඒ වගකීම භාර ගත්තා. මම ආපසු ප්‍රාදේශීය ලේකම්තුමියට විස්තරේ කිවුවා. එතුමිය කිව්වා එතන නොවෙයි වෙන තැනක කියලා. මම කිව්වා නැහැ කියලා. නැවත වෙරංග මන්ත්‍රීතුමාට අරගෙන ඇහුවා. මොකුත් ප්‍රශ්නයක් තියෙනවා ද කියලා. එතුමා කිව්වා මේ ඉඩම එයාගෙ කිසිම ගැටලුවක් නැහැ කියලා. මම ඒ බව ප්‍රාදේශීය ලේකම්තුමියට කිව්වා. එතුමිය කියනවා නැහැ, මෙන්න මේ වගේ පැමිණිලි එනවයි කියලා. මම කිව්වා එතන ප්‍රශ්නයක් නැහැ. අපි පොලිසියත් එක්ක කතා කරලයි මේක කරන්නේ කියලා එතුමියට කිව්වා. ඊට පස්සේ මට 2.30 ට විතර මන්ත්‍රීතුමා කතා කරල කිව්වා. පොලිසියෙන් ඇල්ලුවයි කියලා. මම ඇහුවා ඇයි කියලා. STF එකෙන් ඇල්ලුවයි කිව්වා. බැලුවම කෝල් දීලා තියෙන්නෙ ජනාධිපති විමර්ශන එකට. එතැනින් DIG ට එයාගෙන් IG එකට. DIG තමයි කියලා තියෙන්නේ පොලිසියේ ඕඅයිසී මහත්මයා සමඟ අපි එකතුවෙලා ව්‍යාපාරයක් කරනවා කියලා. ඒක නිසා තමයි ඔය අල්ලල තියෙන්නෙ. මේ සම්බන්ධයෙන් කෝල් දීපු අය අපි දැන් දන්නවා. නමුත් අපිත් එක්ක අමනාපයෙන් නෙවෙයි. අපට පස් ඉවත් කරන්න බැහැ. නමුත් එයා අපෙන් ඉල්ලීමක් කරලා තියෙනවා. අපට වුණේ j.c.b. යන්ත්‍රය අපට ආවේ නැති නිසා මේ අවස්ථාවෙන් ප්‍රයෝජන ගත්තේ. මේ කටයුතු කලේ සද්භාවයෙන් යුතුව. මම මේ සිද්ධිය සංවර්ධන කමිටුවේ කතා කළා. අපි අබමල් රේණුවකවත් වංචාවක්, හොරකමක් කළේ නැහැ. අපි සද්භාවයෙන් කරල මෙහෙම වුනාම හිතට හරි වේදනාවක් ආවා. ඒ ගැන මම මීට වඩා කතා කරන්න යන්නේ නැහැ.

ගරු මන්ත්‍රීවරුනි, උප සභාපතිතුමනි, අද ප්‍රාදේශීය සභා වාරෙදි මට හොඳ ප්‍රිය වචනයක් අසන්න ලැබුණා. වනමල් මන්ත්‍රීතුමාගෙන්. දැන් බල්බ් ගෙනැල්ලා තියෙනවා. මන්ත්‍රීවරුන්ට ලැබෙයි. විදුලිය ගැන කතා කරද්දි නගරවල තල්ගස්වල, මාපලගම, නාගොඩ උඩුගම ඒවායේ හදාගෙන ඊලගට ප්‍රධාන පාරවල් වල ලයිට් ටික හදාගෙන යනවා. ගරු ප්‍රධාන පාරවල් වල හදලා, අතුරු පාරවල් වල ඉදිරියේදී හදයි. නමුත් අපේ විදුලි කාර්මික මහතා ගැන කතා කරනකොට, අපි පසුගිය දවසක හදිසි වැඩකට කතා කරනකොට එයා අසනීපයි. ගෝණදෙනියේ ඥානරත්න කියන මහත්මයා දැනට මාසෙකට විතර උඩදි ලයිට් එක හදල දෙන්න කියල කිව්වා. නමුත් ඒක කරන්න බැරිවුණා. එතුමාගේ මල ගෙදර ගියාම මට හරි කනගාටුවක් ඇති වුණා. මෙහේ විතරක් නෙවෙයි. හැම ප්‍රාදේශීය සභාවකම තියෙන ප්‍රශ්නයක්. ඉතින් මම සද්භාවයෙන් කියන්නේ කිසි කෙනෙකුට අසාධාරණයක් කරන්නේ නැහැ. අපට අලුතින් එකක් දාන්න නම් නොහැකියාවක් තියෙනවා. ඔබතුමාලගේ සහයෝගය දෙන්න. දැනට ඔය පිළිස්සුනු බල්බ් තමයි හදාගෙන යන්නේ. හදිසි අවස්ථාවක් හදිසි මළගෙයක් වගේ අවස්ථාවක් වුනොත් විතරයි ක්ෂණිකව කෙරෙන්නේ. මම කියල තියෙන්නේ ඔබතුමාලට පුලුවන්නම් ලොකු ඉනිමගක් තියාගෙන කතා කරන්න කියලා. හේතුව මොකද, දැන් මෙතන ඉඳලා බෙම්බඩ ලයිට් හදන්න ගියොත් මග ඉඳලා අහනවා අනේ අපේ ලයිට් එක හදන්නෙ නැද්ද කියලා. උඩුගම යන්න ගියොත් ගෝණදෙනියෙදි අහවි. එතකොට ඉනිමගක් තියෙනවනම් ලෙස්ලි බයිසිකලේ හරි යවන්න පුලුවන්. හැමෝම අහන්නේ ලයිට් හදන්නේ නැද්ද කියලා මගෙන්. ලයිට් හදන්න යන වාහනේ තවම හැදුවේ නැහැ. ඒක හැදුවත් වැඩක් නැහැ කියලා හිතෙනවා. දැන් ඒකේ වටිනාකම වගේ තුන්ගුනයක් විතර වියදම් කරලා තියෙන්නේ. ඒ පිළිබඳ තාක්ෂණික නිලධාරී වාර්තාවත් අරගෙන කරන්න පුළුවන් මොකක්ද කියලා බලනවා. හදන්න පුලුවන්නම් හදනවා. නැත්නම් වැඩක් නැහැ.

මොකද කෘ කැබ් එකෙන් අපට ඒකත් කරගන්න පුළුවන්. තවද, අනියම් පදනම මත විදුලි කාර්මිකයෙක් සහ මාර්ග කම්කරුවින කිහිප දෙනෙකුත් බඳවා ගැනීමට මෙම අවස්ථාවේ යෝජනා කරනවා.

ඊළඟට අපේ පියල් මන්ත්‍රීතුමා, ඒ වගේම වනමල් මන්ත්‍රීතුමා මාපලගම වැසිකිලිය ඉදිකිරීම පිළිබඳව කතා කළා. ඒ වැසිකිලිය ලබන මාසේ හදනවා. නෙරංජලී මන්ත්‍රීතුමිය අහපු උඩවැලිවිට්තලාවෙ ප්‍රජාශාලවෙ යතුර තියෙන්නේ කෘෂි පර්යේෂණ නිලධාරි ළඟ. ඒකෙදි අපිට තවම නිසි පවරා ගැනීමත් නැහැ. ඊළඟට ධනංජය මන්ත්‍රීතුමා කියපු රබර් පැක්ටේරිය පිළිබඳව p.h.i. මහත්තයා යවලා පරීක්ෂණයක් කරලා බලන්නම්. අපි ඒකට සුදුසු පියවරක් ගන්නම්. ඒ වගේම එම්.එම්. දිසානායක මන්ත්‍රීතුමා කියපු උනන්විටිය පොලේ කුණු ප්‍රශ්නය ගැන අපි කතා කළා. අඟහරුවාදා පැවැත්වෙන පොළ සුද්ද කරන්න යන්නේ සඳුදා. මම එයාලට කිව්වා බදාදට ශුද්ධ කරලා දෙන්න කියලා. මොකද ඒ කම්කරුවෝ බදාදා 12 - 1 වෙනකොට වැඩේ ඉවරයි. ඒක නිසා ආපහු කැඳවලා ඒ කටයුතු කරන්නම්. මොකද එමෙන්ම දිසානායක මන්ත්‍රීතුමා මට නිතරම කියනවා ගමේ අයත් දෝෂාරෝපණය කළා කියලා.

ඊළඟට පාරවල් පිළිබඳව සහා ගැසට් කිරීමේදී ලොකු ව්‍යාපෘතියක්. පාරවල් පවරාගැනීම සම්බන්ධ ගරු මන්ත්‍රීවරු දැනුවත් වෙලා ඔක්කොම එකට දෙන්න. එතකොට එකවර ඒ කටයුත්ත කරන්න පුළුවන්. අපේ ප්‍රියන්තා මන්ත්‍රී තුමියගේ ගිය සභාවේ මුදල් ගෙවීම පිළිබඳ කතා කලාට ඒක ගෙවන්න ලැබුණේ නැහැ. ඒ කටයුතුවල දී අපිත් අසරණ වෙනවා. මොකද මුදල් ඒ වෙලාවේ ලබාදීමට නොහැකි වීම පිළිබඳව. ඒ අවස්ථාවේ දී එයාල අසරණ වෙනවා. ඒක නිසා සභාව එන්නට පෙර මුදල් කමිටුව රැස් කරලා ගෙවීම් කිරීමට කටයුතු කරනවා. ඒ වගේම වලකුඹුර ළිඳ පිළිබඳ ප්‍රියන්තා මන්ත්‍රීතුමිය කතා කළා. එම ළිඳ පිරිසිදු කර දීමට ඉදිරියේදී කටයුතු කරමු.

ඊලගට අපේ ලක්රුවන් මන්ත්‍රීතුමා ප්‍රජා ශාලාව පවරා ගැනීම පිළිබඳව කතා කළා. ඔබතුමා මූලික වෙලා කටයුතු කරන්න. අපේ වනමල් මන්ත්‍රීතුමා කතා කලේත් විදුලිය පිළිබඳව ස්තුති කරන්න. ටොයිලට් එක පිළිබඳවත්, සභාපති හැටියට මට තීරණයක් අරගෙන එතන හදන්න බැහැ. ඒ ස්ථානය මාර්ගස්ථ ප්‍රවාහන අධිකාරිය භූමියක්. අපට අයිතිය තියෙන්නෙ එතනට මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙක් යොදවලා අවශ්‍ය අවසරය දීම විතරයි. භූමිය මාර්ගස්ථ ප්‍රවාහන අධිකාරියේ. මේකට විරෝධතා එන නිසා තමයි. අපි ප්‍රාදේශීය සංවර්ධන කමිටුවේ දේශපාලනයකින් තොරව ඒකමතිකව සම්මත කරගත්තේ මෙතන වැසිකිළි ඉදිකළ යුතුයි කියලා. ඒ නිසා ඒකේ කිසිම ප්‍රශ්නයක් නැහැ. මම අදාළ නිලධාරීන් සමග අධ්‍යක්ෂතුමා සමග කතා කළා. එතුමා කිව්වා විරුද්ධත්වය ප්‍රකාශ කරන අයට අවහිරයක් නොවන පරිදි ඉදිරියේදී ඒක ඉදිකිරීම කරනවයි කියලා.

ඊලගට ගරු සහබන්දු මන්ත්‍රීතුමා ඔබතුමා කිව්වා මේ බෝඩ් පිළිබඳව. ඒ බෝඩ් අපේ සභාවට කලින් හදපු බෝඩ් වගයක්. රජයේ ආධාර වලින් තමයි හදල තියෙන්නෙ. ඒ බෝඩ් කිහිපයක් ඉතුරු වෙලා තිබුණා. ඒ පාරවල් වල තමයි හයි කලේ. ඒවා ඉතුරුවෙලා තිබුනේ දෙමළ බසින් ලියපු එක වැරදි නිසා. ඒවා නිවැරදි කරල ගෙනත් තමයි සවි කළේ . ඔබතුමා කියපු පාර දැන් ඇස්තමේන්තු කරලා තියෙනවා. ඒකේ වැඩ නොකරපු එකයි තියෙන්නෙ. ඊළඟට අපේ උප සභාපතිතුමා කතා කළා. විශේෂයෙන්ම අපේ ලේකම්තුමියගේ නැන්දම්මා

අභාවප්‍රාප්ත වීම පිළිබඳව හා ගයන්ති මන්ත්‍රීතුමියගේ බාප්පාගේ වියෝව වෙනුවෙන් සභාවේ සියලු දෙනාගේ ශෝකය පලකර සිටිනවා. ඒ වගේම තරංග මන්ත්‍රීතුමා කිව්වා වගේ යම් යම් යෝජනා සඳහා පිට ආයතන වලට යොමු කරන ලිපි වල පිටපතක් ඒ අදාළ මන්ත්‍රීතුමාටත් ලබා දෙන්න කටයුතු කරනවා. ඒ වගේම ගරු මන්ත්‍රීතුමන්ලා ආවේගශීලීව තමන්ගේ පෞද්ගලික අභ්‍යන්තරය ගැන කතා කරන්න එපා. මොකද අපි දැක්කා. පාර්ලිමේන්තුවේ ඇති වූ තත්වයන් පිළිබඳව. අපේ මන්ත්‍රීතුමන්ලා එහෙම ඒ තත්වයකට යන්න ඕනේ නැහැ. මොකද හේතුව අපි ගමේ හැමදේටම එකමුතු වෙලා යන්නෙ. පාර්ලිමේන්තුවේ ඉන්න අය එක්කෙනෙක් යාපනයේ, අනිත් කෙනා හම්බන්තොට. එකිනෙකා මූණ ගැහෙන්නේ නැහැ. ඉතින් ඒක නිසා අපි පෞද්ගලිකව විහිළු කර ගත්තට කමක් නැහැ. ආවේගශීලීව කතා කරන්න එපා. ඒක හොඳ නැහැ. එතකොට අපේකම නැති වෙනවා. මේ සභාව වාසනාවන්ත සභාවක්. ඔබතුමාලා වාසනාවන්තයි. ගරු මන්ත්‍රීවරුනි, ඔන්න මම දැන් සභාපති හැටියටත් සතුටුවෙන, සභාපති කෙනෙක් හැටියටත් අවංකව කතා කරන වෙලාව. ඇත්තටම මම කාටවත් දේශපාලන වශයෙන් අරයා හොද නැහැ. මෙයා හොඳ නැහැ කියලා කියන්නේ නැහැ. අපට සතුට නිදහස ලබා දුන්න අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා නැවත මේ රටේ මොනයම් ක්‍රමයකින් හෝ අගමැති වීමට අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා . ඒ කියන්නේ මම සභාපති වරයා හැටියට පහුගිය අවුරුදු වල හිටියනම් වැඳලා කියලා හරි නාගොඩට වැඩක් කරගන්නවා. අපේ නන්දන මන්ත්‍රීතුමා කිව්වා. මහින්ද මහත්තයා ගැන ඉස්සරහට දැනගන්න පුළුවන් වෙයි කියලා. නමුත් එකක් කියන්නම්. මේ රට 2004 සුනාමියට විනාශ වුණා. 2005දී මහින්ද මහත්තයා බලයට ආවේ, ජනාධිපති වුණා. 2009 වෙනකොට රටේ තිබුන භීෂණකාරී තත්ත්වය , යුද්ධයත් ඉවර කරලා රටේ සෑම අතින්ම සංවර්ධනයක් ඇති කරලා ලංකාව ඉහළට ගෙනාවා. නමුත් අපට පේන විදියට අපි දැක්කනෙ සුනාමියට විනාශ වෙච්ච රට ගොඩ ගත්තා. යුද්දෙත් ඉවර කලා. සංවර්ධනයක් සිදු කළා. මේ අවුරුදු තුනත් තිබ්බ නම්, ඇත්තටම මේ රට කොහොමද කියලා බලන්න තිබුනා. ඉතිං ඒ අවුරුදු 3 පස්සට ගියා. ඒ නිසා ඇත්ත ඇති සැටියෙන් දකිමු. එවැනි නායකයෙක් ආව එක ගැන අපි සතුටු වෙනවා. හැබැයි මතක තියාගන්න. අදත් අපි එතුමගේ වටේ හිටපු යම් යම් අය ගැන විරුද්ධයි. එතුමාගේ වටේ ඔය අපතයෝ හිටපු නිසා තමයි එතුමට ඔය සිද්ධිය වුණේ. එතුමා පරාජය ලබපු එකත් අපේ වාසනාවක්. මොකද එතුමාගේ ජීවිතය ආරක්ෂා වුණා. ඒ අපල කාලය ඉවරවෙලා දැන් යහපත් තැනකට ඇවිල්ලා තියෙනවා. අපි අතිගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා ගැන යමක් කියන්නේ නැහැ. 2015 ජනවාරි මස 8 වැනිදා කිව්ව වගේම තමයි අදත් කියන්නේ. එතුමාට යම් මොකක්හරි වුනා. නැවත තේරිලා එතුමාගේ ජීවිතාරක්ෂාව පතා එතුමා මේ ක්‍රියාමාර්ගය ගත්තා. එතුමාගේ ජීවිතයට හානිදායක තත්ත්වයක් උදා වෙලා තිබුනේ. මන්ද අපි නෙවෙයි පරීක්ෂණ කටයුතු කරලා කියන්නේ. ඊළඟට එතුමා යම් යම් කටයුතු තියෙන නිසා පාර්ලිමේන්තුවේ සුදුසු පුද්ගලයෙක් අගමැති තනතුරට පත් කළා. මාස අටකට උඩදී එතුමා සජිත් මහත්තයට අගමැතිකම ගන්න කියලා තියෙනවා. එතුමා ඒක පිළිගත්තා. ඊළඟට මාස 2කට උඩදි කරු ජයසූරිය මහත්තයටත් කියලා තියෙනවා. ඒ වගේ දෙන්නෙකුට කියලා තියනවා. ඉතින් අපි පිළිගන්න ඕන මේක දීර්ඝකාලීනව එන ප්‍රශ්නයක්. මේක බොරුවක් නෙවෙයි. එතුමාගේ ජීවිතය පිළිබඳ ප්‍රශ්නයක් ඇති වෙන්න ඇති. අපි දන්නේ නැහැ. කොහොම නමුත් මහින්ද මහත්තයා අගමැති වුණා. අපට අවශ්‍ය මැතිවරණයකට යන්න. අපට අවශ්‍ය මැතිවරණයකදී සියලු දෙනාගේ මතය

ප්‍රකාශ කරන්න. අපේ උප සභාපතිතුමා, අනෙකුත් මන්ත්‍රීතුමන්ලා කිව්ව වගේ අපි සහෝදර ලීලාවෙන් තමයි මැතිවරණ කරන්න ඕන. අපි තරහ වෙන්න ඕන නැහැ. තමන් ආදරේ කරන අපේක්ෂකයෙක් ,පක්ෂයක් ජයග්‍රහණය කරවීම තමයි අපේක්ශාව. මේ මනාප ක්‍රමය නිසා තමයි අපට වැරදුනේ. දැන් අර මනාප ක්‍රමය නැහැ. දැන් කබරගොයා තලගොයා වෙලා. ඒ කොහොම නමුත් ජනවාරි පස්වැනිදා ඡන්දය තියෙනවා. ඒකෙදී අපි කවුරුත් මේ විසි හත් දෙනාම එකතුවෙලා මහින්ද රාජපක්ෂ මැතිතුමා ජයග්‍රහනය කරවමු. අපි කාටත් හොඳ හිතින් ප්‍රාර්ථනා කරන්නේ. අපි කවුරුවත් වලට වැටෙන්න කියන්නේ නැහැ. හෘද සාක්ෂියට එකඟව අපේ හිටපු අතිගරු ජනාධිපති, මහින්ද රාජපක්ෂ මැතිතුමා ජයග්‍රහණය කරවමු. අපි අදටත් හදවතින් ජනාධිපති කියන්නේ එයාට. ඒක වෙනස් වෙන්නේ නැහැ. අදත් හෙටත් හදවතේ ජනාධිපතිතුමා වර්තමාන අගමැතිතුමාමයි. ඉතින් මම හිතන්නේ හොඳ වටිනා ජන බලයකින් අනාගතයේ රට භාරගන්න ඉන්න විධායක අග්‍රාමාත්‍යධූරයට එතුමා පත් වේවි. අපි සියලු දෙනාටම එකට කටයුතු කරන්න පුළුවන්. මෙතුමන්ලා කියපු අර ගම්පෙරළිය වැඩසටහන වර්තමානයේ නවත්තලා ද කියලා මම දන්නේ නැහැ. ඒ කටයුතු කරන්න පුළුවන්. ඔබතුමාලගෙන් හරි අපෙන් හරි ඒක අඹමල් රේණුවකින්වත් අඩුපාඩුවක් නැතිව වැඩේ කෙරෙනවනම් හරි. හැබැයි කරද්දි මතක තියාගන්න. ඔබතුමාලා සිහිපත් කරමින් තමයි ඒ කටයුතු වෙන්නෙ. මොකද අපි මුල අමතක කරන්නේ නැහැ. ඔබතුමාලා යෝජනා කරපු දේවල් නිසා. මීට වඩා යමක් මම කියන්නේ නැහැ. අද ඇත්තටම සියලුම මන්ත්‍රීවරුන් සහභාගි වෙලා, මේ කටයුත්ත සිදු කළා. මම මීට වඩා යමක් කියන්නේ නැහැ. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ අපි තරඟ කරන්නේ පොහොට්ටුව ලාංඡනයෙන්. අර සහබන්දු මහත්මයා කිව්ව වගේ මම කපටියෙක් වෙන්න ඇති. හැබැයි හදවතින් එහෙම නැහැ. ඒ වගේම අපේ ක්‍රීඩා තරග වලට මන්ත්‍රීවරුන් ගිහිල්ලා සහභාගි වුනා. ඒ ගැන සතුටුයි. ලේකම්තුමිය ඊයේ ගිහිල්ලා කඹ ඇද්දා. එහෙමනම් ගරු උප සභාපති තුමා ඇතුළු මන්ත්‍රීවරුන්ට ස්තුතිය පුද කරමින්, විශේෂයෙන් ලේකම්තුමිය, නිලධාරීතුමා, ඇතුළු සියලු දෙනාටම සුබ අනාගතයක් ප්‍රාර්ථනා කරමින්, සභාවේ වැඩ කටයුතු අවසන් කරනවා. බුදු සරණයි. ජය වේවා !

සභාපති,
නාගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී

දිනය :-